www.padippakam.com

# රාජ්‍ය ස්වාධිපත්‍යයේ සීමා:

## විසිඑක් වන සියවසේ ආරක්ෂා කිරීම සඳහා ඇති වගකීම

අටවන නීලන් තිරුචෙල්වම් සමරු දේශනය

ගැරත් එවන්ස්

බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව - කොළඹ

2007 ජූලි 29 වන දින

නීලන් තිරුචෙල්වම් ඝාතනයෙහි අටවන සංවත්සරය වන අද දින මින් පෙර කවර දිනකටත් වඩා ශ්‍රී ලාංකිකයන් මෙන්ම පුළුල් ජාත්‍යන්තර ප්‍රජාව ද ඔහු සිහිපත් කිරීමටත් ඔහුගේ ජීවිතයෙන් සහ ඔහු ලබාගත් කාර්ය සාධනයෙනුත් යළි උත්තේජනය විය යුතුව තිබේ. ඔහුගේ අති විශිෂ්ඨ බුද්ධියෙන් සහ දැනුමෙන් ද, ඔහුගේ අපරමිත ශක්තියෙන් ද, ඔහුගේ දේශපාලන කැපවීමෙන් ද සහ ඔහුගේ සුභවාදී බවෙන් ද අපට තව දුරටත් ඍජුව ප්‍රයෝජන ගත නොහැකි නමුත් ඔහු තැනූ ආයතන ද ඔහුගේ අදහස් සහ ඔහු තුළ වූ බුද්ධිමය සහ ප්‍රතිපත්තිමය දේශපාලනඥයා අපට දෙනු ලැබූ ආදර්ශයන් තවමත් අප අතර ජීවමානව පවතී.

නීලන් අති විශිෂ්ඨ ආයතන තනන්නකු විය. ඔහු ගොඩ නැගූ ආයතන අතුරෙන් වඩාත් ප්‍රසිද්ධව ඇත්තේ අද මේ රාත්‍රියේ සත්කාරක ආයතන වන වර්තමානයේ ආචාර්ය රාමා මනී විසින් ඉතා දක්ෂ ලෙසින් මෙන්ම පරිකල්පනමය විචක්ෂණ භාවයකින් යුතුවත් මෙහෙයවනු ලබන ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර කේන්ද්‍රය (International Centre for Ethnic Studies) සහ නීතිය සහ සමාජ භාරය (Law & Society Trust) යන ආයතන දෙකයි. මෙම ආයතන දෙකම ශ්‍රී ලංකාව හා දකුණු ආසියාව තුළ පමණක් නොව ලෝකය පුරා බුද්ධිමය වශයෙන් මෙන්ම දේශපාලනමය වශයෙන් සිය සළකුණු තබාලීමට සමත් ව තිබේ. ඊට අමතරව නීලන් රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, මානව හිමිකම් කාර්‍ය සාධක බලකාය සහ පසුව මානව හිමිකම් කොමිෂන් සභාව යන පොදු ආයතන මෙන්ම, දැන් ඔහුගේ බිරිඳ වන සිත්ති විසින් මෙහෙයවනු ලබන තිරුචෙල්වම් සමාගම නම් ස්වකීය අග්‍රගන්‍ය නීති සමාගම ද ගොඩනැගීමේ දී වැදගත් වැඩ කොටසක් ඉටු කොට ඇත. ආයතන ගොඩ නගා ඒවා මනාව පවත්වාගෙන යාමට ඔහුට හැකි වූයේ තමන් තුළ පැන නැගුණු ප්‍රබුද්ධ අදහස් සහ වෙහෙස නොබලා වැඩ කිරීමේ හැකියාව නිසාම පමණක්ම නොව ඊට අමතරව අන්‍යයන්ට, විශේෂයෙන් ම තරුණ ප්‍රජාවට සැඟවුනු හැකියාවන් පෙන්වා දී  ඒ කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය ඇති කොට ඒ පිළිබඳව වැඩකිරීමට අවැසි දිරිදීමz ලබා දීමට ඔහු සතු වූ හැකියාවද එයට හේතු විය.



படிப்பகம்

සැබවින්ම මූලිකව ගොඩනැගිය යුතු වැඩදායක ආයතනය ලෙස ඔහු සැලකුවෙZ ගැටුමZ හා අරගල ප්‍රචණ්ඩත්වයෙන් නොව නීතියෙන්, ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රවාහය සහ ඵළදායී පාලන ආකෘතීන් හරහා සියළුZ දෙනාගේ අයිතීන් හා අපේක්ෂාවන් සුරැකිනු ලැබූ ශිෂ්ඨ සමපන්න රාජ්‍යයකි. අති විශිෂ්ඨ ව්‍යවස්ථා කටයුතු පිළිබඳ නීතිඥයෙකු ලෙස ලෝක ප්‍රසිද්ධ වූ නීලන් කසකස්ථානය, ඉතියෝපියාව හා නේපාලය ආදී රටවල්වල ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලීන්ට සමීප ලෙසින් සම්බන්ධ විය. මේ සියල්ලටම වඩා ඔහු සිහියේ රැදෙනු ඇත්තේ 90 දශකයේ මැද සහ අග භාගයේ ශ්‍රී ලංකා ආණ්ඩුව ඉදිරිපත් කළ මින් පෙර නොවූ නැවුම් යෝජනාවන්හි ප්‍රධාන නිර්මාණකරුවා ලෙසය. මෙම යෝජනා අවාසනාවකට මෙන් කිසිදා නීතිගත නොවූවත් සත්‍ය වශයෙන්ම දේශපාලන අධිශ්ඨානය ඇතිනම් පමණක් සාධාරණ ව්‍යවස්ථාමය දේශපාලන විසඳුමක් සඳහා එකඟත්වයක් ඇති වේය යන බලාපොරොත්තුවට දිරි ගන්වනවයි.

දේශපාලන අභිමතය එය සොයා එන තෙක් අල්මාරියක් තුළ බලා නොසිටින බව නීලන් දැන සිටියේය. එය උත්පාදනය කර පෝෂණය කළ යුතු බවත් ඒ සඳහා වෙහෙස නොබලා අඛණ්ඩව ක්‍රියාකාරී විය යුතු බව ද ඔහු දැන සිටියේය. ඔහු දකුණු ආසියානු සංස්කෘතිය සහ ජනවාර්ගිකත්වයේ සිට සමාජ ලිංගිකත්වය, දේශපාලන න්‍යාය සහ විශේෂයෙන්ම ව්‍යවස්ථා නීතිය දක්වා වූ අපූර්ව මාතෘකා පරාසයක් තුළ සැබෑ අධ්‍යයන රසයක් සහ රචිත විහිදීමක් සහිත සිත් ඇදගන්නා සුළුZ විද්‍යාර්තයෙකි. එසේම, තමා විශ්වාස කල දෑ ජීවිතයට රැගෙන ඒමට හා ජනතාවගේ ජීවිත තුළ ඒවා සැබෑ කිරීම සඳහා දේශපාලනයේ නිසැකවම අවදානමක් සහ අභියෝග පවතින බව විශ්වාස කළ ඔහු ඔහුව ශාස්ත්‍රීය කටයුතු වලට පමණක් සීමා කිරීම ප්‍රතික්ෂේප කළේය. දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේ (TULF) සාමාජිකයෙකු ලෙස මැතිවරණ දේශපාලන ක්‍රමයට සුම්බන්ධ වීමට ඔහු තුල වූ කැමැත්ත හා පාර්ලිමේන්තුව තුළින් හා වෙනත් රාජ්‍ය යාන්ත්‍රන හරහා ඔහු කළ මෙහෙවර ඛේදනීය ලෙස ඔහුට, ඔහුගේ ඥාතීන්ට සහ අප සියල්ලටම ඔහුගේ ජීවිතය අහිමි කළේ ය.

අද දින මා තෝරා ගත් මාතෘකාව ඍජුවම අදාළ වන නීලන් තිරුචෙල්වම්ගේ ජීවිතයේ තවත් සුප්‍රකට අංශයක් ඇත. ඒ වනාහි විවිධත්වයට ගරු කළ ඔහුගේ සර්වදේශවාදී චින්තනය යි. නීලන් සාමූහික හැඟීම හා බැඳි සිටියේ ජනවාර්ගිකත්වය අභිභවා ගිය දෘෂ්ටියකිනි. ඔහු හිස් විශ්වීයත්වයක් නිසා ඉහත සඳහන් සුවිශේෂ බැඳීම් එකක් වත් නොසලකා හැරියේ හෝ ප්‍රතික්ෂේප කළේ හෝ නොවේ. එසේ නොව එම සියලු දේ වඩා ප්‍රබල ජීවයක් ඇති, වඩා එකිනෙක හා බද්ධ වූ මෙන්ම යුක්ති සහගත වූ ඒකකයක් තුළ එකාබද්ධ කිරීම ඔහුගේ ප්‍රයත්නය විය. සංවර්ධනය වෙමින් පවතින රටවලට සංවර්ධිත රටවලින් උගැන්මට යමක් ඇතිවා පමණක් නොව ඒවාට උගැන්වීමට ද යමක් ඇතැයි ඔහු තර්ක කළේ ය. ඔහුගේ මතවාදය වූයේ බටහිර දේශයන්හි ජනිත වූ පෞද්ගලිකත්වය ඉස්මතු කරන්නාවූ කතිකාව "දකුණු ආසියාවේ ආගමික



படிப்பகம்

හා සංස්කෘතික සම්ප්‍රදායයන් ගැන ඍජු ව සම්බන්ද කිරීම් මගින් පෝෂණය විය යුතු" බවය. ඔහු ප්‍රබල ලෙස තර්ක කළේ එම බටහිර දේශ වාසීන් බටහිර නොවන දේශයන් හි මානව අයිතීන් ගැන උද්වේගවත් වීම බැරෑරුම් ලෙස පිළිගනු ලබනු ඇත්තේ බටහිර රාජ්‍යයන් ද තමන් දේශනා කරන මූලධර්මයන් පිලිපදිමින් ඒවා සාධාරණ ලෙස යොදවා ආදර්ශයක් පෙන්වූවොත් පමණක් ය යනුවෙනි.

ප්‍රස්තුතයන් කෙරේ එබඳු අනුකලනාත්මක එළඹුමක් යොදවමින් පුළුල් ජාත්‍යන්තර කතිකාවන්ට තම දේශය විසින් හා දකුණු ආසියා ප්‍රදේශය විසින් කළ හැකි ප්‍රදානයන් ගැන ආත්ම විශ්වාසයෙන් යුතුව සිටි නීලන්ට තම දේශය වැනි සුවිශේෂ අර්බුදයන්ට මුහුණ පා සිටි නැතහොත් ප්‍රචණ්ඩත්ව හා ප්‍රතිප්‍රචණ්ඩත්ව චක්‍රයක සිරවී සිටි රටවලට උපකාරී වීම සඳහා සැලසුම් වුණු ජාත්‍යන්තර මැදිහත් වීම් ගැන බියක් තිබුණේ නැත. ඔහු වැදගත් යැයි සැලකුයේ එම මැදිහත් වීම ප්‍රතිඵලදායක වේද පමණක් නොව ප්‍රතිපත්ති මූලික හා තිරසාර වේද යන්න ය.

## II

මෙයින් මා අද තෝරා ගත් මාතෘකාව සඳහා ඍජු යොමුවීමක් සැපයේ. එනම්, රාජ්‍ය ස්වාධිපත්‍යයේ සීමා සහ කිසියම් තනි රාජ්‍යයක දේශ සීමා තුළ සිදුවන මහා පරිමාණ මානව හිමිකම් උල්ලංඝනය වීම්, ජන ඝාතන සහ අනෙකුත් සමූල ඝාතන, මහා පරිමාණ ජනවාර්ගික ශුද්ද කිරීම් සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ආදිය සඳහා ප්‍රතිචාර දැක්වීමේ දී ජාත්‍යන්තර ප්‍රජාවගේ සැබෑ භූමිකාව කුමක්ද? යන්න ය. රටවල් විසින් අනෙකුත් රටවල කටයුතුවලට ඇඟිලි ගැසීම, විශේෂයෙන් සංවර්ධිත රටවල් විසින් සංවර්ධනය වෙමින් පවතින රටවල අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීම, අතීතයේ දී සැම විටම ප්‍රතිපත්තිමය හෝ ස්ථිරසාර වූයේ හෝ නොවූයේ යන්නට පොදු මතයක් පවතී. ඒ අනුව එක්සත් ජාතීන්ගේ සංගමයේ ප්‍රකාශනයෙහි 2(7) වගන්තියේ දී "“රටක අභ්‍යන්තර අධිකරණ බල ප්‍රදේශය තුළ අවශ්‍යයෙන්ම සිදුවන කටයුතු සඳහා මැදිහත් වීමට කිසිවෙකුටත් අයිතියක් නොමැතිය”" යන ප්‍රකාශනය අනුල්ලංඝනීය තහංචියක් යැයි ලෝකයේ දකුණු දිග බොහෝ රටවල් දැඩිසේ විශ්වාස කරති.

ඇත්තෙන්ම, යටත් විජිත නිදහස්කරණ යුගය තුල බොහෝ රාජ්‍යයන් සිය නිදහස ලබා ගැනීමත් සමගම ස්වාධිපත්‍යය  යන්න ඉතාමත්ම සංවේදී කාරණයක් වීම තේරුම් ගත යුතුය. ඒ හැම රාජ්‍යයකටම තම නව අනන්‍යතාව ගැන ආඩම්බරයක් ඇති අතර තමන්ගේ ක්ෂණභංගුරභාවය ගැන ද වැටහීමක් ඇති බව අපි දනිමු. ඒ අනුව තමන්ට වඩා ශක්තිමත් ජාත්‍යන්තර ක්‍රියාකාරී රටවල තර්ජන හා බලපෑම් වලට එරෙහිව යොදාගත හැකි ආරක්ෂණයන්ගෙන් එකක් ලෙස මැදිහත් නොවීමේ එම මූලධර්මය ඔව්හු සාමාන්‍යයෙන් සලකති.

එහෙත් අන් සියලු දෙයෙහි මෙන් මේ එළඹුමෙහි ද, අන්තයට ගෙන ගිය දරුණු ලෙස නොපෙනෙන පැත්තක් තිබුණි. එය ඉස්මතුව පෙනුණේ 1990 දශකයේ දී බෝල්කන් ප්‍රදේශයේ හා මධ්‍යම අප්‍රිකාවේ සිදු වූ හෘදය සාක්ෂිය කම්පනයට පත් කරමින් පැතිරුණු මිනිසා විසින් සිදුකළ විනාශයන් කෙරේ ජාත්‍යන්තර ප්‍රජාව දැක් වූ ප්‍රතිචාර අරභයා ය. ඒ අවස්ථා නමින් සඳහන් කරනවා නම්, 1994 රුවන්ඩාවේ සිදු වූ අති දරුණු ජන ඝාතන සහ ඉන් හරියටම වසරකට පසුව ස්‍රෙබ්‍රෙනිකාවේ සිදු වූ ඇදහිය නොහැකි අපරාධ සම්බන්ධව ඒ ප්‍රශ්නය පැන නැගුණි. දිගින් දිගටම ජාත්‍යන්තර ප්‍රජාවගෙන් කිසියම් ප්‍රතිචාරයක් එම අවස්ථාවන් තුළින් ප්‍රබල ලෙස අපේක්ෂා කෙරුණ ද ජාත්‍යන්තර ප්‍රජාව වෙතින් සිදු වූයේ පිළිවෙලක් නැති, අසම්පූරණ, ප්‍රතිකූල ඵල ගෙන දෙන ප්‍රතිචාර ය. එසේම කිසිම ප්‍රතිචාරයක් නොදැක් වූ අස්ථාද විය. යළිත් 1999 දී කොසෝවෝහි ජනවාර්ගික ශුද්ද කිරීම් ආරම්භ වූ කල ජාත්‍යන්තර ප්‍රජාව සමහර විට කළ යුතුව තිබූ පරිදි හමුදාමය මැදිහත් වීමක් ඇත්ත වශයෙන් කරන ලද්දේ රුසියාවේ තර්ජනාත්මක නිෂේධ බලය හමුවේ ආරක්ෂණ මණ්ඩලයෙහි පූර්ව අනුමැතිය ද නොලබා ය. ඒ සමගම ජාත්‍යන්තර ආරක්ෂක සැලැස්මෙහි ඒකාග්‍රතාව පිළිබඳ ව බොහෝ උත්සුක වූ ප්‍රශ්න ඉස්මතු විය.

1990 දශකය පුරාම මැදිහත්වීම සහ රාජ්‍ය ස්වාධිපත්‍යය පිළිබඳ තරගකාරීව අයිතිවාසිකම් කියා පෑම සඳහා විශාල විවාදයක් විය. තර්කයේ එක් පැත්තක් වූයේ දේශ සීමා විරහිත වෛද්‍ය වරුන්ගේ සංගමයේ නිර්මාතෘ සහ දැනට ප්‍රංශයේ විදේශ ඇමති ලෙස කටයුතු කරන බර්නාඩ් කවුච්නර් ඉදිරිපත් කළ මැදිහත් වීම සඳහා ඇති අයිතිය (Right to intervene), හෙවත් වඩා සම්පූර්ණව සඳහන් කරන්නේ නම් මානුෂීය පදනම මත මැදිහත්වීම සඳහා ඇති අයිතිය (Right of humanitarian intervention) නමැති සංකල්පයයි.

එහෙත් විවිධ දෘෂ්ඨී කෝනයන්ගෙන් බලන කළ මෙය ගෝලීය උතුර තුළ බලවත් දෝංකාරයකුද සමගන් ඇති වූ ප්‍රබල සහ එළදායී සාමූහික කෑ ගැසීමක්ව පැවතුණු නමුත් එය ලොව අනෙකුත් රටවල් වටා සිත්හි කා වැදින තරමටම ක්‍රෝදයෙන් දිලිසෙන්නට විය. එසේම, ගෝලීය දකුණ විසින් අතිශයින්ම හා එකාවන්ව ජාතික ස්වාධිපත්‍යය සංකල්පය මත අයිතිවාසිකම් කියා පෑම ඒ සඳහා ශ්‍රේෂ්ඨත්වයක් හා අඛණ්ඩව දෝංකාරයක් ඇති කිරීමට ද හේතු විය. යුද්ධය සඳහා සීමාවන් අඳිනු ලැබී. බංකර ඉදිකරනු ලැබීය. ඒ සමගම වාචික මිසයිල අහසේ සැරිසරන්නට විය. විවාදය බොහෝ සෙයින් වේගවත් හා අප්‍රසන්න එකක් වූ අතර එය 1990 ගණන් වළදී එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ හෝ අන් කොතනකදී හෝ කිසිසේත්ම නොවිසඳී ම කෙළවර විය.

වරෙක එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අන්නන් මෙම විවාදයේ කේන්ද්‍රීය ගැටළුව වී තිබුණ සංකල්පමය උභතෝකෝටිකය සමථයකට පත්කිරීමේ පෞද්ගලික වෑයමක නිරත විය. ඔහු තර්ක කළේ එක් එක් අවස්ථාවේ දී ජාතික ස්වාධිපත්‍යය කිරා මැන බැලිය යුත්තේ ජාත්‍යන්තර මානව හිමිකම් උපකරණ මගින් පිළිගනු ලබන එම පෞද්ගලික ස්වාධිපත්‍යයට අනුව බවය. එහෙත් එම තර්කය පිළිගැනුණේ නැත. එයට හේතුව යථෝක්ත තර්කය මැදිහත් වීමේ ප්‍රශ්නය නිරාකරණය කරීමක් නොව එය යළිත් ආරම්භ කිරීමක් ලෙස සැලකීමය. වර්ෂ 2000 දී ලේකම්වරයා එක්සත් ජාතීන්ගේ සංගමයේ මහා සභාවට ඉදිරිපත් කළ වාර්තාවෙන් මෙම ගැටලුව ප්‍රසිද්ධ වේදිකාවට ගෙන ආවේ අද පවා දෝංකාර නංවන හැගුම්බර සිත් සසල කරවන වදන් මාලාවක් මගිනි. එම වදන් මෙසේ විය: "*මානුෂීය මැදිහත් වීම පිළිගත නොහැකි ලෙස ස්වාධිපත්‍යය වෙත එල්ල වන ප්‍රහාරයක් වන්නේ නම්, බරපතළ ලෙස හා අඛන්ඩව සිදුවන මානව හිමිකම් උල්ලංඝනය වීම් සඳහා අප රුවන්ඩාවට ප්‍රතිචාර දක්වන්නේ කොහොමද? ස්‍රෙබ්‍රෙනිකාවට ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද ?*

පසුව මෙම අභියෝගයට මුහුණ දීමේ කාර්යය කැනඩා රජයේ අනුග්‍රහයෙන් පිහිට වූ "මැදිහත් වීම හා රාජ්‍ය ස්වාධිපත්‍යය පිළිබඳ ජාත්‍යන්තර කොමිසම" (International Commission on Intervention & State Soverignity) වෙත පැවරුණි. එහිදී ඇල්ජීරියානු රාජ්‍ය තාන්ත්‍රිකයෙකු හා එක්සත් ජාතීන්ගේ සංගමයේ අප්‍රිකා උපදේශක මොහමඩ් සහ්නූස් හා සමග එහි සම සභාපතිත්වය දැරීමේ අවස්ථාව මට ද හිමි විය. අපි 2001 වර්ෂය අග දී " සුරැකීම සඳහා ඇති වගකීම " (Responsibility to Protect) නමින් අපේ වාර්තාව එළි දැක්වීමු. අප මෙම වාර්තාව මගින් යථෝක්ත අප්‍රසන්න හා නිස්සාර විවාදය නිරාකරණය කරගැන්මට දායකත්වය සපයන බවට වර්ථමානයේ පොදුවේ පිළිගනු ලබන අතිශය වැදගත් සංකල්ප දෙකක් ඉදිරිපත් කළේය.

ඉන් පළමුවැන්න වූයේ " මානුෂීය මැදිහත් වීම" පිළිබඳ සංවාදයේ යෙදීම ගැන කථා කිරීමට නව විදියක් නිර්මාණය කිරීම ය. ඒ වන විට වෙහෙසකර මෙන් ම වැඩි වැඩියෙන් අශෝභන වෙමින් පැවැති "මැදිහත් වීම සඳහා ඇති අයිතිය" පිළිබඳ වූ විවාදය උඩු යටිකුරු කිරීමට අපි තීරණය කළෙමු. ඒ අනුව අලුත් මුහුණුවරකින් ප්‍රශ්නය ඉදිරිපත් කළෙමු. අප මෙහි දී රාජ්‍යයන් යම්කිසි දෙයක් කිරීමේ "අයිතිය" ගැන තර්ක කරනු වෙනුවට මහත් අන්තරායට මුහුණ පා සිටින ජනතාව ආරක්ෂා කිරීමට ඔවුන්ට ඇති "වගකීම" ගැන අවධානය යොමු කරනු මැනවැයි පෙන්වා දුන්නෙමු. අදාල ඉදිරි දර්ශනය වූයේ මැදිහත් කරුවන් ලෙස ඉදිරිපත් වන්නන්ගේ නොව ආධාර උපකාර ලැබිය යුතු අයගේ ඉදිරි දර්ශනය බව අපි තර්ක කළෙමු. ආලෝක ධාරාව ආපසු එල්ල කැරුණේ එය සැම විටම තිබිය යුතු ඉලක්කය වූ සමූහ ඝාතන, ජන වාර්ගික ශුද්ධ කිරීම් අඛණ්ඩව සිදුවන ස්ත්‍රී දූෂණ, දරුවන් හාමත් වීම ආදී ව්‍යසනයන්ගෙන් ජනතාව ආරක්ෂා කිරීමේ අවශ්‍යතාව වෙතය. මෙසේ ප්‍රශ්නය ඉදිරිපත් කිරිමේදී, ප්‍රධාන ප්‍රතිපත්ති ක්‍රියාකාරීන්ගේ

හැසිරීම සැබවින්ම වෙනස් කිරීම සඳහා නව අදහස්වල හෝ අළුZZතින් අර්තකථනය කළ පැරණි අදහස්වල පවතින බලය බෙහෙවින් අප සිත් තුළ විය.  ඉන් වසර කිහිපයකට පෙර එවක සංවර්ධන කාර්යෙහි නිරත වූවන් සහ පරිසරවේදීන් අතර පැවති විශාල පරතරය අවම කිරීම සඳහා බ්‍රිරුට්ලන්ඩ් කොමිසම විසින් ඉදිරිපත් කරන ලද "ධරණීය  සංවර්ධනය" නමැති සංකල්පය මේ සම්බන්ධයෙන් අප සිත්හි බෙහෙවින්ම පැවති ආකෘතිය විය.  මේ නව තිරරචනයත් සමග රංගන ශිල්පීන්ට සිය දෙබස් වෙනස් කරන්නට සහ තරගයේ සැබෑ ගegMZ මොනවාදැයි නැවුම්ව සිතන්නට සිදු  වුණි.

පළමුවැන්න හා සම්බන්ධ වූ කොමිසමේ දෙවන ප්‍රධාන සංකල්පමය දායකත්වය වූයේ ස්වාධිපත්‍යය පිළිබඳව කථා කිරීමේ නව ප්‍රවේශයක් සඳහා බලකිරීමය. එම නව එළඹුම සුඩාන ජාතික විද්‍යාර්ථයෙකු හා මනා රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වූ (මේ වන විට ජන ඝාතන හා මහා පරිමාණ විනාශකාරිත්වයන් වැළැක්වීමේ ක්‍රියාවලිය සඳහා උපදේශකයෙකු ලෙස එ.ජා. මහලේකම් බැන්කි මූන් විසින් පත් කොට සිටින) ෆැන්සිස් ඩෙං ගේ සංකල්පයක් මත පදනම් විය. එම සංකල්පයට අනුව නව එළැඹුමෙහි හරය වන්නේ පුරාණ වෙස්ට්ෆේලියන් ගිවිසුම අනුව, යුරෝපීය සම්ප්‍රදාය වී පැවැති "පාලනය කිරීම" නොව "වගකීම ඉටු කිරීම" ය. එහි ආරම්භක පියවර වන්නේ සෑම රාජ්‍යයකට ;ම සීමාව තුළ පුරවැසියන් ආරක්‍ෂා කිරීමෙහිලා ප්‍රධාන වගකීමක් තිබේය යන කාරණයයි.  එහෙත් එය අවසන් කාරණය නොවේ. අයෝග්‍ය අභිමතාර්ථ හෝ  තම නොහැකියාව හේතුවෙන් හෝ රාජ්‍යයක් සිය වගකීම තුළ අසමත් වන අවස්ථාවන්හිදී ආරක්‍ෂා කිරීම සඳහා ඇති අතුරු වගකීම පුළුල් ජාත්‍යන්තර ප්‍රජාව මතට වැටෙයි. එය ඉතා කෙටියෙන් පවසනවා නම් දැන් අප කෙටියෙන් පවසන ආකාරයට R2P (Responsibility to Protect) හෙවත් ආරක්‍ෂා කිරීම සඳහා ඇති වගකීම නමැති සංකල්පයේ හරය යි.

ඉහත දැක්වූ පදනම සැලසුම් කිරීමෙන් පසුව ආරක්ෂාව සැපයීමේ වගකීමෙන් ප්‍රයෝගිකව අදහස් වන්නේ කුමක්දැයි යන්න කොමිසම අර්ථකතනය කළේය. මනුෂ්‍ය ඝාතන, ජනවාර්ගික ශුද්ද කිරීම්, යුද්ධාපරාධ හා මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සිදුවෙමින් පවතින හෝ සිදුවන්නට ආසන්න අවස්ථාවන්හි ඵලදායීව ප්‍රතික්‍රියා දැක්වීම ඉන් පැහැදිලිව ම අදහස් වේ. තවද  හද කම්පා කරවන අවස්ථාව දක්වා පැමිණි නොමැති නමුත් එවැනි තත්ත්වයක් කරා පිරිහීමේ හැකියාව ඇති තත්ත්වයන් වඩා නරකට යාමට පෙර වළක්වා ගැනීම යන්නද මෙයින් අදහස් වෙයි. එසේම අප පැවසූ අන්දමේ මහා විනාශයන් හේතුවෙන් සුනු විසුනු වූ සමාජ නැවත ගොඩනගමින් යළි එවැනි සිදුවීම් නැවත සිදු නොවීම තහවුරු කිරීම ද මෙයින් අදහස් වෙයි.

'R2P' ක්‍රියාපටිපාටිය මගින් අවශ්‍ය වන කටයුතු බොහෝ කොට ම වැළැක්වීම හා සම්බන්ධ ය. එනම්, රාජ්‍යයේ හැකියා ශක්තිය වැඩි දියුණු කිරීම, මැසිවිලිවලට පිළියම් යෙදීම, නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම යන කටයුතු ය. නමුත් වැළැක්වීම් අසමත් වන්නේ නම් සිදු වෙමින් පවතින අතිශය ම්ලේච්ඡ අපරාධ නැවැත්වීම සඳහා ආර්ථික, දේශපාලන, රාජතන්ත්‍රික, නීතිමය, ආරක්ෂක හෝ අවසානයේ හමුදාමය උපායන් වැනි කවර හෝ ක්‍රියා මාර්ගයන් R2P සඳහා අවශ්‍ය වනු ඇත.

එක් එක් රාජ්‍යයන් සඳහා මෙම අදාළ වගකීම දැරිය යුත්තේ කවුරුන් විසින් ද යන ප්‍රශ්නය මෙහි දී මතු වේ. 'R2P' යන්නෙන් මුලින් ම අදහස් වන්නේ රාජ්‍යයක් ඉහත සඳහන් අන්දමේ අපරාධවලින් තම රටවැසියන් ආරක්ෂා කිරීමටත් අන්‍ය රාජ්‍යයන්ට එම කටයුතු කිරීම සඳහා හැකියාව ගොඩනගා ගැන්මට උදව් කිරීමටත් ඇති වගකීම ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධාන අරභයා එම වගකීම වන්නේ කල්තබා අනතුරු ඇඟවීමේ වගකීම, ඵලදායක වැළැක්වීමේ උපක්‍රම ක්‍රියාත්මක කරවීම සහ අවශ්‍ය වූ විට ශක්තිමත් ප්‍රතික්‍රියා සංසජ්ජනය යි. සිවිල් සංවිධාන අරභයා 'R2P' යන්නෙන් අදහස් කැරෙනුයේ කළයුතුව ඇත්තේ කුමක්ද? කළයුත්තේ කවුරුන් විසින් ද? කුමන අවස්ථාවේ ද? යන කරුණු වෙත ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු කරවීම ය.

"ආරක්ෂා කිරීම සඳහා ඇති වගකීම' වැනි සංකල්පයක් නිර්මාණය කිරීම එකකි. එය කෙරේ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය ලබා ගැනීම තවත් දෙයකි. "ආරක්ෂා කිරීමේ වගකීම පිළිබඳ වාර්තාව 2001 දෙසැම්බර් මස දී ප්‍රකාශයට පත් වූ විට එහි කේන්ද්‍රීය තේමාවට ජාත්‍යන්තර වශයෙන් දිගින් දිගටම අවධාන පථයේ ගමන් කිරීමට සමත් වීම සිත් ඇදගන්නා සුළු සිද්ධියක් විය. මෙහි විශේෂත්වය නම් 2001 සැප්තැම්බර් 11වන දින ඇමරිකාවේ සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයෙන් පසු ජාත්‍යන්තරයේ වැඩි අවධානය රාජ්‍යයන්හි අභ්‍යන්තරයෙහි සිදුවන මානව හිමිකම් ව්‍යසනයන් වෙත නොව ජාත්‍යන්තර ත්‍රස්තවාදය කෙරේ යොමුව තිබුණු යුගයක එය සිදු වීම ය.

සංකල්ප පිළිබඳ ඉතිහාසයේ සැබවින්ම ඉතා සුළු කාල පරිච්ඡේදයක් වන, එනම් වසර පහක් වැනි කෙටි කාලයක් තුළ දී, "ආරක්ෂා කිරීම සඳහා ඇති වගකීම' යන සංකල්පය අපේ ජාත්‍යන්තර කොමිසම තුළ පහළ වූ සිතුවිලි මාත්‍රයක සිට පුළුල් ලෙස පිළිගැනෙන ජාත්‍යන්තර ප්‍රතිමාණයක තත්ත්වයට වර්ධනය වී ඇති අතර එය අනාගතයේ දී ජාත්‍යන්තර නීතියේ චාරිත්‍රගත විධි නියමයක් බවට පත් වීමේ හැකියාව ද දරන්නේ ය.

මෙම සංකල්පය පළමු ව බැරෑරුම් ලෙස ප්‍රතිග්‍රහණය කරන ලද්දේ එවකට ඉස්මතු වෙමින් පැවැති අප්‍රිකානු ඒකාබද්ධ සංවිධානයේ මූලධර්ම තුළ ය. ඉන් පසු වසර දෙක තුන තුළ

දී එය ශාස්ත්‍රීය විචාරකයන් හා ජාත්‍යන්තර නීතිඥයන් අතර සැබෑ කැමැත්තක් දිනා ගැනීමට සමත් විය. එහෙත් එයට ලොකුම ඉදිරි පියවර ගැනුණේ 2005 සැප්තැම්බර්හි එක්සත් ජාතීන්ගේ 60 වන ලෝක නායක සමුළුවේ දී ය. ඊට පෙරාතුව ඒ සඳහා සූදානම්වීම් වශයෙන් 2004 ආරක්ෂක වැඩ පිළිවෙළට ඇති නව තර්ජන පිළිබඳ ඉහළ මට්ටමේ වාර්තාකාර මණ්ඩලය (මෙහි මා සාමාජිකයෙකු වීම මහත් පහසුවක් විය) විසින් සපයන ලද වාර්තාව එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා තමාගේ ප්‍රධාන වාර්තාවට ඇතුළත් කර තිබුණි. එම ලේඛන දෙකේම ආරක්ෂා කිරීම සඳහා ඇති වගකීම අවධාරණාත්මක ව ග්‍රහණය කර ගෙන තිබුණේ ය. එහි රැස් වූ රාජ්‍ය නායකයන් 150 කට වැඩි සංඛ්‍යාවක් ඒකමතික ව අනුමත කළ ලෝක නායක සමුළුවේ ප්‍රතිඵල වාර්තාව තුළ ඉහත සඳහන් වාර්තා දෙකේ කේන්ද්‍රීය නිර්දේශ කිසිදු ව්‍යාකූලතාවකින් තොරව පිළිගත්තේය.

2005 සැප්තැම්බර් ලෝක නායක සමුළුවෙන් පසු තවත් වැදගත් සංකල්පීය සංවර්ධනයක් සිදු වී තිබේ. එනම්, පසුගිය වසරේ (2006) අප්‍රේල් මස දී ආරක්ෂක මණ්ඩලය විසින් "ආයුධ සන්නද්ධ ගැටුම්වලදී සිවිල් ජනතාව ආරක්ෂා කිරීම" ගැන තේමා යෝජනාවක් සම්මත කර ගැනීම ය. එහි දි කලින් ලෝක නායක සමුළුවේ දී සම්මත කර ගැනුණු "ආරක්ෂා කිරීම සඳහා ඇති වගකීම' පිළිබඳ තීරණය යළි පැහැදිලිවම අවධාරණය කර ඇත. ඉන් පසුව පැන නැගුණු සුවිශේෂ අවස්ථාවන්හි දී එය ප්‍රයෝජනයට ගැනෙණු දක්නට ලැබුණි. උදාහරණ වශයෙන් ඩාෆූර් පිළිබඳ 2006 අගෝස්තු 31 දින සම්මත වූ 1706 වන යෝජනාව තුළ එම සංකල්පය ඇතුළත් විය. අදාළ මූලධර්ම කවරේදැයි හඳුනා ගැන්ම සඳහා එක්සත් ජාතීන්ගේ මහා සභාවේ සම්මත යෝජනාවක් ප්‍රයෝජනවත් විය හැකි බව ඉහත සඳහන් රාජ්‍ය නායක සමුළුවේ දී සිදු වූ සම්මතයෙන් අවිවාදයෙන් පැහැදිලි වූ අතර විධායක කටයුතු අරහයා වැදගත් වන්නේ ආරක්ෂණ මණ්ඩලය යි. එතැන පයේ ඇඟිල්ලක් හෝ ගසාගෙන සිටීමට අපට දැන් හැකි වී තිබේ.

R2P විශ්වාස කරන අප බොහෝ දෙනෙකුට මෙය හොඳ ප්‍රවෘත්තියක අවසානයක් පමණක් වේ. අප සටන දිනුවා යැයි අප සිතුවොත් එය අප විසින්ම අපව මුළා මුළා කර ගැන්මකි. ස්වෛරී රාජ්‍යයක් තුල මහා සමූළ ඝාතනයන් හෝ ජන වාර්ගික ශුද්ධ කිරීම් හෝ අනෙකුත් මානුෂත්වයට එරෙහි අපරාධයන් හෝ මේ සියල්ල නැවත ඇතිවන R2P තත්ත්වයකදී ( සත්‍ය වශයෙන් ම ඇතැම් එවැනි සිදුවීම් අනාගතයේදී ටික කලකට, කොහේදී හෝ ඇතැම් විට අප සිතනවාට වඩා ඉක්මනින් ඇති විය හැකිය) මුළු ලෝකය පුරා ඉබේට ම සියල්ලන් තුළම පොදුවේ පහළ වන ප්‍රතික්‍රියාවක් පැන නගිනවා ඇත. අප සියලු දෙනාම නැවත කිසිදා සිදු නොවිය යුතු යැයි කියා සිටි දෙයක් යළිත් සිදුවනවා යන භ්‍රාන්තියෙන් ඇළලී යනු ඇත. අපේ එම ප්‍රතිචාරය නිසා ඵලදායි යමක් සිදුවනු ඇත. එම තර්ජනය නවත්වා ලීමට ශක්තිමත් ජාත්‍යන්තර ක්‍රියාවක් ද වේ. වසර ගණනාවක් තිස්සේ ලොව වටා මෙම විෂය පිළිබඳව කථා

කරමින් සහ ලියමින් සිටින්නෙකු වශයෙන් ලෝක සමළුවේදී ලගා වූ එකඟතාවය තරමක් බිඳෙන සුළු අබිතාලමක් මත පදනම්ව තිබෙන බැව් මා හොඳින් දනිමි.

2005 වර්ෂයේ දී රුසියාවේ ද සහයෝගය ඇති ව සංවර්ධනය වෙමින් පවතින රටවල් අතුරෙන් කීප දෙනෙකුගේ කණ්ඩායමක් රාජ්‍ය ස්වාධිපත්‍යය පරිපූර්ණව හා කිසිදු සීමාවක් පැනවීමෙන් තොරව භාවිතයට ඉඩ දිය යුතු යැයි අති උත්සන්න සටනක නිරත වූහ. එම ක්‍රියාව කොතරම් වගකීම් රහිත එකක් වුවත් එය ඔවුන්ගේ ස්ථාවරය විය. අවසානයේ යුරෝපා සංගමයෙන් සහ එක්සත් ජනපදයෙන් ලැබුණු සහාය එතරම් අවිරෝධී එකක් නොවීය. (2003 ඉරාක අක්‍රමණයෙන් අනතුරුව ඔවුන්ගේ සහාය ද උපකාරශීලී නොවීය). සැබවින්ම තීරණාත්මක වූයේ දකුණු අප්‍රිකාවේ නායකත්වය යටතේ සහරාවට දකුණෙන් පිහිටි අප්‍රිකානු රාජ්‍යයන් දිගින් දිගටම දුන් සහයෝගයත් ඓතිහාසිකව වැදගත් ලෙස ස්වාධිපත්‍යය සීමා කිරීමේ මූලධර්මයන් ප්‍රධාන ලතින් ඇමරිකානු රාජ්‍යයන් විසින් වැළඳ ගැනීමත් ය. එමෙන්ම මෙහිදී මුලින් වැට උඩ සිටි විශේෂයෙන් ඉන්දියාව වැනි රටවල නායකයන් නම්මා ගැනීමට අවසන් මොහොතේ පෞද්ගලික රාජ්‍ය තාන්ත්‍රික මෙහෙයුමක නිරත වූ කැනේඩියානු අග්‍රාමාත්‍ය පෝල් මාර්ටින්ගේ මෙහෙවර ද සිහිපත් කළ යුතු ය.

2005න් පසුව මාගේ සංචාරයන්හි දී මට නිතරම අසන්නට සිදු වූ දෙයක් නම් රටවල් ගණනාවක නියෝජිතයන් (ආසියාවේ අය ද මීට ඇතුළත් වූ අතර ශ්‍රී ලංකාවේ අය ද මේ පිරිසට අයත් වූහ) මට කියා සිටියේ ඔවුන් 2005 ලෝක නායක සමුළුවේ පොදු මතයට විරුද්ධ වීමට අකැමැති වූ නමුත් නායකත්ව සමුළුවේ ප්‍රතිඵල වාර්තාවට 'R2P ' වගන්ති අන්තර්ගත වීම ගැන තමන් එතරම් සතුටු නොවන බවයි. මට වාර ගණන අමතක වන තෙක් අසන්නට ලැබුණක් වූයේ 'R2P ' යනු හුදෙක් මානුෂීය මැදිහත් වීම සඳහා වෙනත් නාමයක් පමණක් බවත් ඒ අනුව බලවත් රටවලට, විශේෂයෙන් බටහිර දේශයන්ට, කුඩා රටවල අභ්‍යන්තර කටයුතුවලට අත පෙවීමට ඉඩ සැලසෙන බවත්ය. ඒ කෙසේ වුව ද මේ ගැන මා කෙතරම් අසංවේදිව සිටියත් දැඩි කම්පනයක් ඇති කළ සිද්ධියකට ද මට මුහුණ පෑමට සිදු විය. නිව්යෝර්ක් නුවර පිහිටා ඇති අර්බුද සමථ කණ්ඩායමේ කාර්යාලයේ ප්‍රධානියා මට මීට සති දෙකකට පෙර තමන් මැද පෙරදිග පිහිටි අරාබි-ඉස්ලාමීය රාජ්‍යයක නියෝජිත පිරිසේ නායකයා හා සමඟ කළ සංවාදයක් වාර්තා කරමින් සඳහන් කළේ"ආරක්ෂා කිරීමට ඇති වගකීම නැමති සංකල්පය බටහිර අධිරාජ්‍යවාදීන්ගේ මනස් තුළ හැර වෙන කොහේවත් නොපවතියි" යැයි ඔහු පැවසූ බවයි.

මෙතැනදී සිදුව ඇති වැරැද්ද කුමක් ද? අනාදිමත් කාලයක සිට පැවත ආ විවාදයකට ප්‍රයෝගික වූත් ප්‍රතිපත්ති ගරුක වූත් විසඳුමක් ලබා දීමට සමත් නව ප්‍රවේශයන් ලෙස බොහෝ දෙනාට පෙනුණු මූලධර්මයකට එරෙහිව මේ තරම් අනවරත ප්‍රතිරෝධයක් පවතින්නේ ඇයි? විශ්වසාධාරණ මානසිකත්වයෙන් යුත් අපට (මෙහිදී මෙවැනි ගැටලු අරභයා නීලන් තිරුචෙල්වම්

තුළ පැවති අසාමාන්‍ය ශිෂ්ටසම්පන්න අචාරශීලිභාවය හා සමබර ගුණෙන් යුතු එළඹුම ගැන මා කළ සඳහන යළි උපුටා දැක්වීමට කැමැත්තෙමි) එම විවාදය යළිත් නිවැරදි මාවතට ගෙනවුත් මනුෂ්‍ය ඝාතන හා මානව විරෝධී සංහාර වළක්වා ගන්නේ කෙසේදැයි අපට වධ දෙන මේ ප්‍රශ්නය නිරාකරණය කිරීමට අවශ්‍ය ප්‍රතිචාරය ජනිත කරවනු වස් කළ හැකි කිසිවක් තිබේ ද?

මෙහිදී අපට ආමන්ත්‍රණය කිරීමට අවශ්‍යව තිබෙන්නේ 'R2P' පිළිබඳව යම් ප්‍රමාණයකට සෑම දෙසකම, විශේෂයෙන් ගෝලීය දකුණේ පවතින, ප්‍රධාන වැරදි වටහා ගැනීම් හතරකට මුහුණ දී ඒවාට පැහැදිලි පිළිතුරු සැපයීමයැයි මා සිතමි.

<u>**පළමුවන වැරදි වැටහීම**</u> :"' R2P' යනු  හමුදාමය මැදිහත් වීමක් පමණි". "සරලව එය මානුෂීය මැදිහත්වීම සඳහා වන අනෙක් නමයි". සහතික වශයෙන් ම මෙය එසේ නොවේ. එය කොපමණ වරක් කියා පැවත් ප්‍රමාණවත් නැත. අන් සෑම දෙයකටත් වඩා ' R2P ' යනු ප්‍රබල ලෙස "වැළැක්විය හැකි ක්‍රියාමාර්ග" ගැනීමකි. මෙහිදී මහා පරිමාණ ඝාතන, ජනවාර්ගික ශුද්ධ කිරීම් හෝ වෙනත් මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ තත්ත්වයට ඇද වැටීමට ඉඩකඩ ඇති අවස්ථා හඳුනා ගෙන උචිත වැළකුම් ප්‍රතික්‍රියා සියල්ලම එතැනට යෙදවීම ය. මෙහිදී දේශපාලනමය, රාජ්‍යතාන්ත්‍රික, නීතිමය හා ආර්ථික යන සියලු අංශ ඇතුළත් කර ගැනේ. වැළකීමට ඇති වගකීම යන්න බොහෝ සෙයින් ජාත්‍යන්තර ප්‍රජාවගේ වගකීමට ඇතින් ඇති, අතිශයින්ම රජය සතු වගකීමකි. එය ජාත්‍යන්තර ප්‍රජාව වෙත පැමිණි විට ඔවුන්ගේ වැළැක්වීමේ ප්‍රතිචාරයෙන් විශාල කොටසක් විය යුත්තේ රටවලට උපකාර කරගැනීම සඳහා සහාය වීමය. ලෝක සම්මේලන ප්‍රතිඵල වාර්තාවේ 138 වන පරිච්ඡේදය මෙය හොඳින් පැහැදිළි කරයි. එනම්,

> *"සෑම තනි රාජ්‍යයකටම ස්වකීය ජනතාව ජනසංහාරයන්ගෙන්, ජනවාර්ගික ශුද්ධ කිරීම්වලින් සහ මානුෂ්‍යත්වයට එරෙහි අපරාධයන්ගෙන් ආරක්ෂා කිරීමේ වගකීම පැවරී තිබේ. මේ වගකීම තුළට, සුදුසු හා අවශ්‍ය උපාය මාර්ග අනුව එබඳු අපරාධ සඳහා උසිගැන්වීම් වැළැක්වීම් ඇතුළුව, එම අපරාධ වැළැක්වීම ඇතුළත් වේ. ජාත්‍යන්තර ප්‍රජාව මෙම වගකීම ක්‍රියාත්මක කරවීම සඳහා රාජ්‍යයන්ට උචිත පරිදි දිරිමත් කිරීම හා ආධාර සැපයීම කළ යුතුය.*

එසේම, වාර්තාවේ 139 වෙනි පරිච්ඡේදයේ නැවතත් ලෝක නායකයින් එකමතිකව ප්‍රකාශ කරන්නේ:

*"අපි අවශ්‍ය සහ යෝග්‍ය අයුරින් ජන සංහාරයන්ගෙන්, යුධ අපරාධයන්ගෙන්, ජනවාර්ගික ශුද්ධ කිරීම වලින් සහ මානුෂ්‍යත්වයට එරෙහි අපරාධයන්ගෙන් සිය ජනතාව ආරක්ෂා කිරීමේදී රාජ්‍යයන්ට සිය ශක්තිය වැඩිකර ගැනීම සඳහා උපකාර කිරීමට සහ අර්බුද සහ ගැටුම් ව්‍යාප්ත වීමට පෙර පීඩනයක පසුවෙන රාජ්‍යයන් සඳහා සහාය වීමට කැපවීමට බලාපොරොත්තු වෙමු"*

වැළැක්වීමට අසමත්, ප්‍රතිචාර අවශ්‍ය වන්නා වූ අවස්ථා ද සැබැවින් ම ඇති විය හැකිය. එහෙත් ප්‍රතිචාර යනු යුදමය හමුදාමය මැදිහත් වීමක් ලෙස අදහස් කළ යුතු නැත. එයට දේශපාලනමය, රාජ්‍යතාන්ත්‍රික, ආර්ථික හා නිතීමය බලපෑම් ඇතුළත් විය හැකිය. මේ සියලු පියවර පෙළඹවීම් තත්ත්වයේ සිට ආක්‍රාන්තිමය තත්ත්වය තෙක් විහිද යා හැකිය. එසේම අඩු බලහත්කාරකමේ සිට වැඩි බලහත්කාරකම දක්වා විහිද යා හැකිය. මෙය යුදමය ශක්තිය අරභයා ද සත්‍ය වේ. මේ සම්බන්ධයෙන් "මැදිහත්" වීම හා රාජ්‍ය ස්වාධිපත්‍යය පිළිබඳ ජාත්‍යන්තර කොමිසම අවධාරණය කළ පරිදි "වැළැක්වීම මෙන්ම ප්‍රතික්‍රියා දැක්වීම සඳහා වන වගකීම භාවිතයේ දී සෑම විටම වඩා බලහත්කාරමය හා ආක්‍රාන්තිමය පියවර ගැනීමට පෙර අඩු බලහත්කාරමය හා ආක්‍රාන්තිමය පියවර ගැන සලකා බැලීම සිදුවිය යුතුය." අන්තික අවස්ථාවන්හි දී අවසාන පියවර ලෙස බලහත්කාරමය යුද පියවර ගැන නොසිතන්නේ ද නැත. මහා පරිමාණ ජන ඝාතන හා වෙනත් දරුණු අපරාධ වැළැක්වීම සඳහා ගත හැකි එකම පියවර එය බව පෙනුණු විට එම පියවර ගත යුතුව ඇත. උදාහරණ වශයෙන් රුවන්ඩාවේ දී හා ස්‍රෙබ්‍රනිකාවේ දී ඒ එසේ බවට කා තුළවත් සැකයක් නොතිබුණි. ඒ කෙසේ වුවද 'R2P' මුලධර්මය යනු අන් කිසිවක් නොව හමුදාමය මැදිහත්වීමක්මය යන්න පැවසීම එම මුලධර්මය අතිශයින්ම විකෘති කිරීමකි.

**<u>දෙවන වැරදි වැටහීම</u>** : දෙවනි වැරදි වැටහීම මේ ප්‍රතික්‍රියා එකතුවෙහි විරුද්ධ අන්තයෙහි පවතින්නකි. එනම් R2P යනු හැමකෙනෙකුම හැම දෙයකින්ම ආරක්ෂා කිරීම පිළිබඳ සංකල්පයක් යන්නයි. මෙබඳු ප්‍රශ්නයක් පැන නැගීමට ඉඩ ඇති බව මා සිතන්නට වූයේ දැනට මාස කිහිපයකට පෙර (1990 දශකයේ දී මැදිහත් වීම හා ස්වාධිපත්‍යය විවාදයට දැඩි සේ සම්බන්ධ වී සිටි) අග්‍රගණ්‍ය රාජ්‍ය තාන්ත්‍රිකයෙකු මගෙන් ඇසූ ප්‍රශ්නයකට පසුව බව මට මතක තිබේ. එතුමා මගෙන් අසා සිටියේ "උත්තර ධ්‍රැවයේ එස්කිමෝවරුන් ලෝකය උණුසුම් වීමේ ප්‍රතිවිපාකයෙන් ආරක්ෂා කිරීමට ජාත්‍යන්තර ප්‍රජාවට වගකීමක් ඇති බව ඔබ පිළිගන්නවා ද?" යනුවෙනි! භාෂාමය අර්ථ අනුව බලන කල මේ කාරණයේ දී කිසියම් ආකාරයක ආරක්ෂාවක් ලබාදීමේ වගකීමක් තිබේ. ඒ සමාන තවත් වගකීම් පැවරෙන ප්‍රස්තුත ලෙස එච්.අයි.වී/ඒඩ්ස් වසංගතය, න්‍යෂ්ටික ආයුධ බහුල වීම, ආදී තව නොයෙක් දෑ තිබෙන බව දනිමු. නමුත් මෙවැනි අවස්ථාවන්හිදී R2P සංකල්පයට වඩා "මානව ආරක්ෂාව" යන්න භාවිතා කිරීම ඉතාමත්ම යෝග්‍ය භාෂා ආවරණයකි.

www.padippakam.com

ඉහත සඳහන් කළ අන්‍ය අවස්ථා සඳහා 'R2P' සංකල්පය භාවිතයෙන් සිදුවන්නේ හද සසල කරවන මිනිස් ඝාතන, ජනවාර්ගික ශුද්ධ කිරීම් වැනි මනුෂ්‍යත්වයට එරෙහි අපරාධයන්ට එරෙහිව නෛසර්ගිකව පැන නගින විශ්වීය ක්‍රියා කලාප ඒකරාශි කරවීම සඳහා එම සංකල්පයට ඇති ශක්තිය හීන කොට අවසානයේ එය වැඩක් නැති දෙයක තත්ත්වයට ඇද හෙළීමකි. R2P යෙදුම වැළඳගැනීමේ ප්‍රධාන හේතුව එහි වූ "මැදිහත්වීමට ඇති අයිතිය" නැමති වචනයෙහි නොතිබුනු සීමාන්තික, හද සසල කරවන සිද්ධීන්හිදී ඵලදායීවූත්, ඒකඟත්වය මත් පදනම්වූත් ප්‍රතිචාර යන අර්ථයන් උපදවීමේ හැකියාවයි.

අප 'R2P' සංකල්පයෙහි අර්ථය පුළුල් කරමින් ඉහත සඳහන් කළ පරිදි 'පොදු මිනිස් ආරක්ෂාව' නැමති න්‍යාය පත්‍රයේ සියලු අංග ඇතුළත් කර ගැනීමට තැත් දැරුවොත් ඉන් සිදු වන්නේ එම සංකල්පය වනාහී ඇඟිලි ගැසීමේ සිහින් අවකාශය ලෙස දැකීමට සූදානම්ව සිටින්නන් උසි ගැන්වීම ය. එවිට 'R2P' යනු ලෝකයේ උතුරුකරයේ රටවලට තම සිතැඟි පරිදි ඊනියා ශිෂ්ටාචාරය පතුරුවා හැරීමේ ව්‍යාපාරයේ යෙදීමට විවෘත අරාධනාවක් ලැබේ යනුවෙන් ප්‍රකෝප වීමට එම ව්‍යාපාරයෙන් අතීතයේ හොඳින් බැට කා ඇති ගෝලීය දක්ෂිණේ රටවලට හැකිවනු ඇත.

මෙතැන ප්‍රශ්නය වී ඇත්තේ - මා මීට පෙර සඳහන් කළාක් මෙන් - කිසිසේත් 'R2P' වැඩ පිළිවෙලේ මූලික අංගය නොවන බලහත්කාර හමුදාමය මැදිහත් වීම පිළිබඳව ය. ඇත්තෙන්ම අන්තයට පිරිහුනු අවස්ථාවන් සඳහා එය බැහැර කළ නොහැකි ප්‍රතිචාරයක් ව පවතී. ඒ අනුව 'R2P' මූලධර්මය වනාහි විවිධ ප්‍රතිපත්තිමය උපකරණ සමුදායක දී හමුදාමය ක්‍රියා මාර්ගය ගැනීමේ ඉඩකඩ මඳක් හෝ විවෘත කරනු ඇතැයි තේරුම් ගත් විට නිතැතින්ම සිදු වන්නේ එම සංකල්පයට නරක නාමයක් ලැබීමය.

කෙටියෙන් කිව යුත්තේ, (මෙය කොපමණ වාරයක් පුණරුච්චාරණය කළත් මදි යැයි හැඟේ) 'R2P' යනු සැම දෙනාම සැම දෙයින් ම ආරක්ෂා කිරීම නොව මනුෂ්‍ය ඝාතන, ජනවාර්ගික ශුද්ධ කිරීම් සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධවලින් මිනිසුන්, ගැහැණුන් හා දරුවන් ආරක්ෂා කිරීම ය. එම අපරාධ දැනට සිදුවෙමින් පවතින ඒවා විය හැකිය. නැතහොත් සිදුවන්නට ආසන්න යැයි බිය උපදවන සුළු ඒවා විය හැකිය; නොඑසේ නම්, ප්‍රබල වැළැකුම් කටයුතු නොයෙදුව හොත් වැඩි කල් නොගොස් එබඳු තත්ත්වයකට ඇද වැටෙන්නට ඉඩ ඇතැයි පෙනෙන අවස්ථාවක් විය හැකිය.

<u>**තුන්වන වැරැදි වැටහීම**</u> :මෙම තුන්වන වැරදි වටහා ගැනීම සැබවින්ම දෙවැන්නේ ම තවත් ස්වරූපයකි. එනම්, 'R2P' යනු "පොදුවේ ගැටුම් හා මානව හිමිකම් උල්ලංඝනයට ප්‍රතිචාර



படிப்பகம்

දැක්වීමකි" යන අදහස ය. මෙහි ඇති ගැටලුව 'R2P' මූලධර්මය ලෝකයේ පවතින සකලවිධ අයහපත් දේට (ඒඩ්ස් වසංගතයේ සිට කාලගුණ විපර්යාස තෙක්) යෙදවෙන පරිදි පුළුල් කිරීම නොව අවිචාරවත්ව යම් යම් පටු ක්ෂේත්‍ර සඳහා යොදා ගනු ලැබීම ය. එසේ වුවත් මනුෂ්‍යයන් කුමන ආකාරයේ හෝ ප්‍රචණ්ඩ ගැටුමක බිහිසුණු බවින් හා දුක් වේදනාවන්ගෙන් සහ ප්‍රජා පීඩක මානව හිමිකම් උල්ලංඝනයන්ගෙන් ආරක්ෂා කරගත යුතු බව සත්‍යයක් වන නමුත් නියම 'R2P අවස්ථා යනු කවරේදැයි සීමා කොට දැක්වීම අවශ්‍යව තිබේ.

'R2P' අවස්ථාවන් වනාහි ආණ්ඩු විසින් තමන්ගේම ජනතාවට එරෙහිව සිදු කරන සකලවිධ වූ මානව හිමිකම් උල්ලංඝනයන් හෝ සියලු ආකාරයේම අභ්‍යන්තර ගැටුම් අවස්ථා ලෙස දර්ශනය කරනු ලැබුවොත් සිදු වන්නේ ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය පොදු එකඟතාවක් ගොඩ නඟා ගැනීමට හෝ පවත්වා ගෙන යාමට නොහැකි වීම ය. එවිට ඇති වන තත්ත්වය කුමක්ද? එක් අතකින් ලෝකයේ උතුරු ගෝලයේ රාජ්‍යයන් විසින් තමන්ගේ වැදගත් ජාතික ස්වාර්ථයන් හා කෙළින්ම සම්බන්ධ නැති විදේශ අවස්ථාවන්ට පැටලීයාම සාධාරණීකරණය කරන්නේ කෙසේදැයි වෙහෙසෙන්නාවූ ද අනෙක් අතින් දකුණු අර්ධ ගෝලයේ රාජ්‍යයන් තමන්ගේ ස්වාධිපත්‍යයට ඉහළින් එන ඇඟිලි ගැසීම්වල අන්තරායට විවෘතව ඇතැයි සිත් කරදර කර ගන්නාවූ ද තත්ත්වයන්ට ශීඝ්‍රයෙන් ඇද වැටීම ය.

නැවතත් අපි මෙසේ පවසමු 'R2P අවස්ථා යනු මහා පරිමාණ ඝාතන, ජනවාර්ගික ශුද්ධ කිරීම්, හෝ ඒ සමාන මහා පරිමාණ දරුණු අපරාධ ඇති වෙමින් පවතින හෝ ඇති වන්නට ආසන්න බව පෙනෙන හෝ කිසියම් වැළකුම් පියවරක් නොගත හොත් තව දුරටත් පිරිහීමේ හැකියාවක් ඇතැයි හැගෙන සිද්ධීන් පමණකි. ඒවා ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානයට යොමු විය යුත්තේ ඒවායේ ඇති හෘදය සාක්ෂිය කම්පනයට පත් කරන ස්වභාවය නිසාය.

උදාහරණයක් ලෙස 2003 දී ඒකාබද්ධ ආක්‍රමණය සිදුවෙන විට ඉරාකය R2P තත්ත්වයක නොතිබුණි. මක් නිසා ද යත්, එහි විශාල ලෙස මානව හිමිකම් උල්ලංඝනය වීම් සිදු වෙමින් පැවතිය ද (එය ජාත්‍යන්තර අවධානයට හා ප්‍රතික්‍රියාවන්ට තුඩු දී හෙළා දැකීම් හා ආර්ථික සම්බාධකයන්ට හේතු වුවත්), අතීතයේ පැහැදිළිවම මහා කෲර අපරාධ සිදුවී තිබුණු නමුදු ( 1980 දශකයේ අග භාගයේ කුර්දිවරුන්ට සහ 1990 දශකයේ මුල් භාගයේ ෂියා මුස්ලිම්වරුන්ට විරුද්ධව) 2003 මුල් කාලයේ එරටට එරෙහි ඒකාබද්ධ ආක්‍රමණය සිදුවන අවස්ථාවේ ඇත්තෙන්ම එවැනි අපරාධ සි වෙමින් හෝ එවැන්නක් පිළිබඳ සැකයක් හෝ නොතිබුණි. මෙයට වෙනස්ව යමින් දැනට මේ 2007 ජූලි මාසයේ ඉරාකයේ පවතින තත්ත්වය R2P අවස්ථාවක් ලෙස විස්තර කිරීම යෝග්‍යත වනු ඇත' මක් නිසාද යත් විශේෂයෙන් රට මධ්‍යයෙන් විදේශීය හමුදා වහා ඉවත් කර ගැනුණහොත්, ඉරාක රජයට පාලනය කර ගත නොහැකි අයුරින් වත්මන් තත්ත්වය ජාතිභේදවාදී සහ නිකායවාදී ප්‍රචණ්ඩක්‍රියා සහ ජනවාර්ගික

ශුද්ධ කිරීම් දක්වා වේගයෙන් පිරිහිය හැකි බැවිනි. nsh සඳහා සෑම හේතුවක්ම පැවතින එවැනs තත්ත්වයකදී ජාත්‍යන්තර ප්‍රජාවට හෘද සාක්ෂියක් ඇතිව පසකට වී බලා සිටිය නොහැකිය.

සැබවින්ම කිසිවෙකුත් නිල වශයෙන් එය එවැන්නක්යැයි ප්‍රකාශකර නොමැති වුවත් 1990 දශකයේ මුල බුරුන්ඩි දේශය 'R2P තත්ත්වයක් හැටියට පැහැදිලිව ම නම් කළ හැකි උදාහරණයකි. තවද, එම අවස්ථාව කෙරේ බලහත්කාර හමුදාමය මැදිහත් වීමක් සිදු වුණේ නැත. සිදු වුණේ කවුරුනුත් බිය වූ පරිදි දරුණුතම දේ ඇතිවීම වළකාලන ශක්තිමත් දැඩි වැළකුම් පියවර ගැනීම පමණි. එතැන පැවතුණේ අසල්වැසි රුවන්ඩාවේ සිදු වූ ජනඝාතන ප්‍රචණ්ඩත්වයේ තත්ත්වය වෙත ඇද වැටීමට ඉඩ තිබූ ස්වභාවයකි. බුරුන්ඩියේ එය සිදුවීම වළකා ගැනුණේ නෙල්සන් මැන්ඩෙලා මැදිහත් වීමත්, දකුණු අප්‍රිකාවේ හමුදාමය සහභාගිත්වයත්, ජාත්‍යන්තර අර්බුද සමථ කණ්ඩායම සිය විග්‍රහය හා කරුණු ඉදිරිපත් කිරීමත්, නව සාම සාධක කොමිසම බුරුන්ඩිය තම ප්‍රථම කාර්යය බවට පත්කර ගැනීමත් ඇතළු බොහෝ ජාත්‍යන්තර සහභාගිකයන්ගේ දැඩි කාර්යශීලිත්වය නිසාය.

<u>**හතරවන වැරදි වැටහීම**</u> : අවසාන විශාල වැරදි වැටහීම, "R2P යනු විශාල වශයෙන් ජීවිත හානි හෝ මහා පරිමානයෙන් ජනවාර්ගික ශුද්ධ කිරීම් සිදුවෙමින් පවතින හෝ එවැනි දෑ පිළිබඳ සැකයකට තුඩු දී ඇති සෑම සිද්ධියකදීම බලහත්කාර හමුදාමය ක්‍රියාමාර්ග සාධාරණීකරනය කරන්නක් යන්නයි. පෙරටත් වඩා පැහැදිළි ලෙස තේරුම් ගත යුතු වන්නේ වෙනත් රටක ස්වාධිපත්‍යට අදාළ සීමාව තුළ පොදු සම්මුතියකින් තොරව බලහත්කාර හමුදා බල ඇණි විසිරුවා හැරීමට නම් හුදෙක් එක් නිර්ණායකයක් නොව බහුවිධ නිරණායකයන් සපුරාලිය යුතු බවයි. මෙය හුදෙක් කිසියම් බැරෑරුම් සීමාවක් පැන ගොස් ඉන් ඔබ්බට ගිය කල ආක්‍රමණය ඇරඹීමට සුදුසු අවස්ථාවයි කිය හැකි අන්දමේ සරල දෙයක් නොවේ.

අප ඉහත සඳහන් කළ මැදිහත්වීම හා රාජ්‍ය ස්වාධිපත්‍යය පිළිබඳ ජාත්‍යන්තර කොමිසම (ICISS) 2001 වාර්තාවේ පැවසූ ආකාරයට සහ 2005 ලෝක නායක සමුළුවට පෙර ඉහළ මට්ටමේ මණ්ඩලය එක්සත් ජාතීන්ගේ සංගමය වෙත ඉදිරිපත් කළ වාර්තාවේ කියූ පරිදි, සහ එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අන්නන් නායක සමුළුවට පූර්වගාමී ව ඉදිරිපත් කළ වාර්තාවෙන් පැවසූ පරිදි මෙන් ම 'R2P' මුලධර්මය හා එකඟ වන සෑම කල්පනාකාරී ආධාර කරුවෙකුම මනාව පැහැදිලි කර ඇති ආකාරයට, මානව රැකවරණය උදෙසා හමුදාමය මැදිහත්වීම් යන්න හුදෙක් තනි පුද්ගලයෙකු විසින් නොව සම්පූර්ණ ප්‍රවේසම් සහගත මිණුම් මාලාවක් විසින් නියම කළ යුතු අතිශයින්ම භයානක වුක් බරපතළවුත් පමණට වඩා එහා ගිය අධි අසාමාන්‍ය උපායකි.

එවැනි නිර්ණායකයන්ගෙන් පළමුවැන්න නම් ඒ තුළින් ජනතාවට එල්ලවෙමින් පවතින හෝ එල්ලවිය හැකියි සිතිය හැකි තර්ජනයන්හි බරපතලකමය. හමුදාමය ක්‍රියාමාර්ගයක් වැනි බැලු බැල්මට අන්තගාමී පියවරක් සාධාරණීකරණය කිරීමට මහා පරිමාණයෙන් සිදුවෙන ජීවිත හානි හෝ ජනවාර්ගික ශුද්ධ කිරීම් වැනි දැඩි ප්‍රතිවිපාකයන් හා සම්බන්ධවීම අවශ්‍ය වෙයි. එහෙත් ඒ සමගම ඒ හා සමාන වැදගත්කමින් යුත් තවත් නිර්ණායක හතරක් තෘප්තිමත් කළ යුතුව තිබේ. යෝජිත යුදමය ක්‍රියාමාර්ගයෙහි ප්‍රේරණය හෝ මූලික අරමුණ (මිලිටරි ක්‍රියාවලිය අපේක්ෂිත තර්ජන නවතා ලීම ද නැතහොත් වළකාලීම සඳහා ද? නොඑසේ නම් වෙනත් ප්‍රධාන අරමුණක් සඳහා ද?); යුදමය ක්‍රියාව යනු අන් සියලු දෑ අසමත් වූ කල ගනු ලබන අවසාන පියවර ද? එනම්, ලැබී තිබුණේ යැයි සාධාරණව සැලකිය හැකි සාමකාමී විකල්ප පැවතුණි ද? එම ප්‍රතිචාරය කෙතරම් සමානුපාතික ද? ඊට අමතරව යුදමය ප්‍රතිචාරයන් මගින් කෙබඳු ඵලවිපාක සිදුවනු ඇතිද? - එනම් යුද ආක්‍රමණය නිසා සමස්ත වශයෙන් අයහපතට වඩා යහපතක් සිදු වනු ඇති ද?

මානව හිමිකම්වලට එල්ලවන සැබෑ තර්ජනයන් කෙසේද යත් යමෙක් මේ ප්‍රාරම්භක මිණුම 2003 ඉරාක අක්‍රමණයේ සම්පූර්ණ සීමාව තුළ පුළුල් කළේ නම් ( අද නොව ඒ වන විට අප දැන සිටියේ කුමක්දැයි යන්න දෙස බැලීමෙන් පවා) ආක්‍රමණයේ ප්‍රතිඵලයන්හි සමබබරතාව බොහෝ දුරට ධනාත්මකව වූවාදැයි යන්න පිළිබඳ බරපතල සැකයන් ඇති කිරීමට බොහෝ විශ්ලේෂණයන් අවශ්‍ය නොවනු ඇත.

ලෝක නායක සමුළුව පිළිබඳ අපේක්ෂාවන් සුන් වූ තැනක් ගැන ද සඳහන් කළ යුතුව තිබේ. මා ඉහතින් සඳහන් කළ සියලු පූර්ව වාර්තාවන්හි විදිනියමයන් ආරක්ෂක මණ්ඩලයෙන් සම්මත කර ගැනෙනු  ඇතයි යන බලාපොරොත්තුවෙන් බලය යෙදවීමේ එම විධිනියම තර්කාන්විතව ඉදිරිපත් කොට තිබුණත් ඒවා ලෝක නායක සමුළුව විසින් සම්මත කර ගැනුණේ නැත. එහිදී සිදු වූයේ එක් අතකින් බලය යෙදවීම සඳහා තීරණ ගැනුණු කිසි විටෙක වත් එබඳු සීමා පැනවීමක් නොතිබිය යුතු යැයි විශ්වාස කළ ඇමරිකා එක්සත් ජනපදයත් අනෙක් අතින් බලය යෙදවීම සඳහා මාර්ගෝපදේශ පනවා එය පරිපාලනය කිරීම වනාහි ඇතැම් අවස්ථාවන්හිදී වත් බලය යෙදවීම නීත්‍යානුකූලයැයි පිළිගැන්මෙන් එයට අනුබල දීමක් යැයි (මට පෙනෙන අන්දමට දැඩි සේ නොමඟ ගොස්) තර්ක කළ ගෝලීය දකුණේ ඇතැම් රාජ්‍යයනුත් අතර දෙපැත්තට ඇදීමකි. කතුරක අඬු දෙක මෙන් වූ මෙම රාජ්‍ය තාන්ත්‍රික පීඩනයේ ප්‍රතිඵලය වූයේ යථොක්ත මාර්ගෝපදේශ සම්මත නොවීමය.

සැබවින්ම මේ ආකාරයේ කිසිම නැණවත් මිම්මක් නොතිබුනානම් සහ ආරක්ෂක මන්ඩලය විසින් මෙය මාර්ගෝපදේශයක් ලෙස පිළිගනු ලැබුවා නම් , ඒවා යම් නිශ්චිත අවස්ථාවක කුමන අයුරින් භාවිත විය යුතු ද යන විවාදය නතර කිරීමට හැකි වන්නේ නැත. නිදසුන් වශයෙන් අද දින ඩාෆූර්හි තත්වය එබඳු එකකි. නමුත්  අදාළ වාදයන් කෙරෙහි

www.padippakam.com

අවධානය යොමුකරමින්, තර්කයන්හි දුර්වලතාවන් හෙළිකරමින් සහ පොදුවේ එකගතාවකට අනුබල දෙමින් සම්පූර්ණයෙන්ම හිටි හැටියේ මතුවෙන වර්ථමාන ක්‍රම වලට වඩා ඒවා උපකාර නොවේයැයි විශ්වාස කිරීම තරමක් දුෂ්කරය.

මා මෙන්ම වෙනත් අය පැහැදිළි කළ සියලු වරදවා වටහා ගැනීම් සඳහා පිළිතුරු වහා සැපයිය හැකි වුවත් 'R2P' මූලධර්මයේ ප්‍රදීපය නොනිවා පවත්වා ගෙන යාමට නම් සැහෙන විග්‍රහ ප්‍රයත්න හා ආධාරකාරී ප්‍රකාශන සිදුවිය යුතු බවට සැක නැත. ඒ සමගම අනාගතයේ කවර දිනකවත් අතීතයේ සිදු වූ සමූල ඝාතන හෝ කම්බෝජියානු හෝ රුවන්ඩානු හෝ බොස්නියානු විනාශයන් සිදු නොවනු ඇත කියාත්, වත්මන් ඩාෆූර් සහ නුදුරු අනාගත ඉරාක විපත්තියක් අනාගතයේ සිදු නොවනු ඇත ආදී වශයෙනුත් මීට පෙර කිසිවිටෙකත් නොතිබුණු විශ්වාසයක් 21 වන සියවසේ දී අප විසින් ගොඩනැගිය යුතුව තිබේ.

මෑත කාලයේ මේ අතුරෙන්, මා ඇතුළු අර්බුද සමථ කණ්ඩාම සහ වෙනත් ප්‍රධාන ගෝලීය රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් සම්බන්ධ වූ එක් උත්සාහයක් ලෙස නිව්යෝක් නගරය කේන්ද්‍ර කොටගත් "ආරක්ෂා කිරීමට ඇති වගකීම පිළිබඳ නව ගෝලීය මධ්‍යස්ථානයක්" ඇති කිරීම සහ ඒ සඳහා අරමුදල් රැස් කිරීම සඳහා වන ව්‍යාපෘතියක් ඇරඹුවෙමු. එහි බලවත් උතුරු දකුණු නියෝජනයක් ද ක්‍රියාකාරීත්වයක් ද පැවතුණි. මේ සඳහා ලංකාවේ ජනවාර්ගික අධ්‍යන පිළිබඳ ජාත්‍යාන්තර කේන්ද්‍රය (ICES) වැනි අපූර්ව ආයතන ද නුදුරේදීම සම්බන්ධ වනු ඇතැයි මා අපේක්ෂා කරමි. බලගතු උතුරු-දකුණු ස්වරූපයක් සමග එකිනෙක පරයා යන තත්ත්වක එම වාදයන් සඳහාම ක්‍රියා කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන, සමාන අදහස් දරණ රාජ්‍යයන් සහ ජාත්‍යන්තර සංවිධාන ආදියෙහි ලොව පුරා පැතිර ඇති අඛන්ඩ ක්‍රියාකාරකම් සඳහා උපාය මූල උත්පේරකයක් ලෙස මෙය ක්‍රියාත්මක වෙනු ඇත. ඇත්තෙන්ම මේ රටේ සහ මේ කලාපයේ නිසැකයෙන්ම මෙයට විරුද්ධවන ඇතැම් පිරිස් සිටිය හැකි නමුදු මෙහි අසාසිටිනන්ගෙන් බොහෝ දෙනෙක් මෙය නොමග යවන සුළු ප්‍රයත්නයකැයි නොසිතනු ඇතැයි මා බලාපොරොත්තු වෙමි.

සැබවින්ම රාජ්‍ය ස්වාධීපත්‍යය යනු මිනීමැරීම සඳහා බලපත්‍රයක් නොවේය එසේත් නැතිනම් රාජ්‍යය මිනීමැරුම් හෝ සිය පුරවැසියන්ගෙන් විශාල පිරිසක් බලහත්කාරයෙන් අවතැන් කිරීම හෝ වෙනත් අය එසේ කිරීමේදී පසෙකට වී සිටීම වැනි කුමක් හෝ මූලික වශයෙන් නොඉවසිය හැකි අයුතු යමක් වරදක්ය යන අදහස පිළිබඳ සංකල්පීමය එකඟතාවයකට පැමිණීමට ලෝකය උමතුවෙන් මෙන් ශත වර්ෂ ගණනාවක් වැනි දිගු කාලයක් ගෙන තිබේ. අවසානයේ, ආරක්ෂා කිරීමට ඇති අයිතිය යන මූලධර්මය 2005 ලෝක රාජ්‍ය නායකයින්ගේ සමළුව විසින් ඒකහෙළා පිළිගැනීමත් සමග දැන් මේ අළුත් ශත වර්ෂය තුළ අප ඒ සඳහා පිළිගැනීමක් දිනාගෙන තිබේ. මගේ අපේක්ෂාව, සහ මා සිතන්නේ මෙහි රැස්ව සිටින ඔබ සැමගේ ද අපේක්ෂාව, නම් එම



படிப்பகம்

සම්මුතිය කිසිදු ලෙසකින් බිඳ වැටෙන්නට ඉඩ දීම බේදවාචකයක් වනු ඇති බවයි. එබන්දක් සිදුව ඇතැයි නොසිතමි. එසේ වුවද 'R2P' මූලධර්මය ප්‍රතිපත්තිමය වශයෙන් දිගින් දිගටම පිළිගැනී පවතිනු ඇතිවා පමණක් නොව භාවිතයෙන් ද එය ශක්තිමත් ව ක්‍රියාත්මක වනු ඇතැයි සහතික කර ගැන්ම පිණිස ලොව පුරා සිටින හිතහොඳ මිනිසුන් හා ගැහැණුන් ඉමහත් ප්‍රයත්නයක නිරත විය යුතුව ඇත.

III

මී ළඟට මා අවසාන වශයෙන් යොමු වන්නේ, මෙම සභාවේ සිටින ඔබ ඇතැමෙකු ද තමන්ගෙන් ම අසනු ඇති සහ තව ටිකකින් මගෙන් ප්‍රශ්න කරනු ඇති කරුණකට ය. එනම් මේ කියන ලද සියලු දේ අද දින ලංකාවට අදාළ වන්නේ කෙසේ ද? නීලන් තිරුචෙල්වම්ගේ මෙන්ම තවත් දහස් ගණනාවකගේ ද ජීවිත බිළිගත් මේ කුරිරු හා පැහැදිළිවම නොනවතින ගැටුම නියම ආකාරයෙන් 'R2P' තත්ත්වයක් ලෙස විස්තර කළ හැකිද? එසේ නම් එයින් පැන නගින නිගමන මොනවා ද? කුමක් කිරීම කවරෙකුගේ වගකීමක් ද?

පසුගිය වසර මැද එදිරිවාදිකම් යළි ඇරඹූ දින සිට රජය හා එල්ටීටීඊය තම යුද කටයුතු සහ භීෂණ ක්‍රියා සහ ත්‍රස්තවිරෝධී මෙහෙයුම් යම් සීමාවක් තුළ පවත්වා ගැනීමට ප්‍රවේසම් වූහ. පසුගිය මාස 20 පමණ කාලය තුළ 4500 කට වැඩි පිරිසක් මරණයට පත්ව ඇති අතර රජයේ හමුදා මෙන් ම එල්ටීටීඊය දිගින් දිගටම අන්තර්ජාතික මානුෂීය නීති උල්ලංඝණය කර තිබේ. වත්මන් ප්‍රචණ්ඩකාරිත්වය මහා පරිමාණ අපරාධ තත්වයට හෝ පැහැදිලි ජන සංහාර, යුද අපරාධ, ජනවාර්ගික ශුද්ධ කිරීම් හෝ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ තත්ත්වයට ඇද වැටී සීමාව ඉක්මවා ගොස් නැත. ප්‍රචණ්ඩකාරිත්වය මහා පරිමාණ විපත්තියක හා ජාත්‍යන්තරව පිළිගැනෙන විනාශයක සීමාවෙන් යන්තම් මෙපිට නවත්වා ගෙන තිබේ.

ඍජුව අතිවිඳින්නන්ට යුද්ධය විනාශකාරී සහ කෲර අත්දැකීමක් බව අපි දනිමq' සිය දහස් සංඛ්‍යාවක් මේ වන විට (UNHCR දත්ත අනුව තුන් ලක්ෂ ගණනක්ද, රජයේ වාර්තා අනුව දෙලක්ෂක් පමණද) කොටි ප්‍රහාරයන් හා බෝම්බ හෙලීම් වලින් හෝ රජයේ ගුවන් ප්‍රහාර හා මල්ටි බැරල් ප්‍රහාරයන්ගෙන් දිවි ගලවා ගැනීමෙන් අනතුරුව ස්ථිර අවතැන්වීමවලට මුහුණ දෙමින් මාස ගණන් වනාන්තර තුළ හෝ කඳවුරු තුළ හෝ අඩු පහසුකම් සහිතව සිය නෑ හිතවතුන්ගේ නිවෙස් තුළ වෙසෙති.

අප දන්නා තවත් දෙයක් නම් යුද්ධය නැගෙනහිරින් උතුර වෙත විහිදුණ හොත් මෑත කාලීන ඉතිහාසය සහ වත්මන් දේශපාලන විචල්‍යතා පිළිබඳ වැටහීමෙන් යුතු විග්‍රහයන් අනුව මේ තත්ත්වය වඩා නරක අතට හැරේ යැයි බියවීමට ඕනෑතරම් හේතු තිබෙන බවය. මෙය දැනටමත් සිදුවෙමින් පවතින බව පෙනේ. මෑත කාලීන ශ්‍රී ලංකා ඉතිහාසයේ සමූහ මිනීවළවල්,

බරපතළ යුද අපරාධ සහ ජනවාර්ගික ශුද්ධ කිරීම් යන මහා පරිමාණ අති දරුණු ක්‍රියාවන් පිළිබඳ නිදර්ශන ඕනෑතරම් තිබේ. තව ද දෙපාර්ශවයේ ම මෙතෙක් පැවති සංයමය ක්‍රමයෙන් දුර්වල වෙමින් පවතින බවට සිත් සසල කරවන ලකුණු පහළ වෙමින් පවතී. දෙපාර්ශ්වයේ ම වචන පාවිච්චිය සහ තර්ජනවල ඇති දරුණු ස්වභාවයන් සැලකිල්ලට ගනිමින් මීළඟ සටන ශ්‍රී ලංකාවේ සම්මතයන් අනුව වුව ද අත්‍යන්ත ස්වභාවයක් දරනු ඇති බව අනුමාන කළ හැකියයි.

යුද්ධය උතුරේ දැනට එල්ටීටීඊය යටතේ ඇති භූමිය වෙත විහිදුණ හොත් එය මෑතකදී නැගෙනහිර පෙදෙසේ සිදු වූවාට වඩා දරුණු වීමට ඉඩ තිබේ. සිවිල් වැසියන් කෙරේ එහි ප්‍රතිවිපාක අති විනාශදායක වනු ඇත. යුද්ධය වඩ වඩා කුරිරු වත්ම එය උතුරුකරයෙන් පිටස්තර පෙදෙස් වෙත විහිදී යාමට බොහෝ ඉඩකඩ තිබේ. එය සමහර විට සිවිල් ජනතාව වෙත හිතාමතා එල්ල කරන ප්‍රහාර මගින් අන්තගාමී මෙන්ම දේශපාලනමය වශයෙන් හානිකර ප්‍රතිචාර අනෙක් පාර්ශවයෙන් ලබා ගැන්ම පිණිස කරන දෑ විය හැකිය. එබඳු ප්‍රහාරයන් හා ඒවායින් නියතව ම වර්ධනය කරන ජාතිවාදී ආතතිය හේතුවෙන් දැනට ඉතිරි වී ඇති නීතියේ ආධිපත්‍යයෙහි කොටස් තව තවත් වියැකී යාමට ඉඩ තිබේ.

මේ සියල්ල ශ්‍රී ලංකාව 'R2P' තත්ත්වයක පවතී යන්න තර්ක කිරීම පහසු කරයි. මෙය කාම්බෝජයේ, රුවන්ඩාවේ, ස්‍රේබ්‍රේනිකාවේ හෝ කොසවෝහි හරියටම දැන් සිදුවෙමින් පවතින හෝ සිදුවීම්වලට ආසන්න අකාරයක මහා ක්‍රෑර අපරාධ තත්ත්වයක් නොවිය හැකි නමුත් මෙය ඇත්තෙන්ම එවැනි අන්තයක් කරා පිරිහීමේ හැකියාව ඇති අවස්ථාවකි. එසේ නම් එය පුළුල් ජාත්‍යන්තර ප්‍රජාවගේද උදව් සහ සහාය ඇතිව තවදුරටත් පිරිහීම නතර කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින්ම වළකාලිය හැකි ක්‍රියාමාර්ගයන් ඉල්ලා සිටින R2P තත්ත්වයකි. ශ්‍රී ලංකා රජය සහ ජාත්‍යන්තර ප්‍රජාව අතර සහයෝගීතාව ඇතිකරගත හැකි ඵලදායී වළකාලිය හැකි උපායමාර්ගය කුමක් විය හැකිද? ඒ ගැන සියලු අවශ්‍ය ප්‍රස්තුතයන් අවශ්‍ය සියලු විස්තර ද සහිතව සර්ව සම්පූර්ණ විශ්ලේෂණයක් හෝ නිර්දේශයක් ඉදිරිපත් කිරීමට මට මෙය අවස්ථාවක් නොවේ. අර්බුද සමථ කණ්ඩාමේ අප මේ අවස්ථාවට සහභාගී වන්නට අරඹා තවම වසරක් ගත වූවා පමණි. අපි තවම සිදු වන්නේ කුමක් දැයි අධ්‍යනය කරමින් සිටිමු. තව ද දැනට මත් සෑහෙන දිගු වේලාවක් මේ දේශනය කරගෙන ගොස් ඇතැයි මට හැගේ. ඒ කෙසේ වුවත් අපේ විනිශ්චය අනුව නීතිමය, යුදමය හා දේශපාලනමය වශයෙන් එම ක්‍රමෝපාය කෙබඳු විය යුතු ද? යන්න ගැන ප්‍රධාන අංගයන් ඇතුළත් කෙටි සටහනක් ඉදිරිපත් කරන්නට වෑයම් කරමි.

පළමුවෙන්ම අන් සෑම රාජ්‍යයන්ට සේම සිය වැසියන් සියළු දෙනා ආරක්ෂා කිරීමේ ආණ්ඩුවේ මුඛ්‍ය වගකීම හඳුනාගනිමින් නීතියේ රැකවරණ යටතට වැසියන් සියළු දෙනාම එකසේ ඇතුළත් කිරීම තහවුරු කිරීම සඳහා පියවර ගත යුතුය. මේ සම්බන්ධයෙන් වන ඉතිහාසය මෙය වැඩිදියුණු කිරීම සඳහා විශාල අවකාශයක් ඉතිරි කොට ඇති බව පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාව පිළිබඳව අර්බුද සමථ කණ්ඩායමේ නවතම වාර්තාවට අනුව කොට් සංවිධානය

සහ රජයේ හෝ රජයට සම්බන්ධ ආරක්ෂක හමුදා යන දෙපාර්ශවය විසින්ම සිදු කරන ලද පැහැරගෙන යාම් අතුරුදහන් කිරීම් සහ ඝාතනය කිරීම් සිද්ධීන් සිය ගණනකි. නීතිය සැබවින්ම සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තුළ මෙවැනි සිදුවීම් සිදුව තිබේ. අද වන විට රජයේ පාර්ශවයේ පුද්ගලයන් විසින් කර ඇති මානව හිමිකම් උල්ලංඝන සිද්ධි අරභයා අධිකරණ ක්‍රියා මාර්ග ගත් බවට ප්‍රකාශ වී ඇත්තේ එක් අවස්ථාවක පමණකි.

අද අවශ්‍ය ප්‍රමුඛතම අවශ්‍යතාවය වන්නේ නිශ්චිතව වරද කරුවන් නීතිය ඉදිරිපිටට ගෙන ඒමයි. මෙයින් අදහස් වන්නේ සාක්ෂිකරුවන් බිය ගන්වා ඇති බවට සාධක ඇති පොලීසියේ සහ ආරක්ෂක හමුදාවල උදවිය විනයානුකූල කරවීමයි; එසේ ම සාක්ෂිකරුවන් ආරක්ෂා කෙරෙන ප්‍රබල වැඩ පිළිවෙළක් පිහිටුවිය යුතුය. මෙහිදී ශ්‍රී ලංකාවේ අධිකරණ ක්‍රමය ගැන උනන්දුවක් දක්වමින් සහයෝගය දක්වන අන්‍ය රාජ්‍යයන්හි උපකාර ලැබිය හැකිය. ඒ අතර විනිසුරු උඩුගමගේ සභාපතිත්වයෙන් යුත් ජනාධිපති කොමිසමට අවශ්‍ය ප්‍රමාණයේ ස්වාධීන ප්‍රතිපාදන ලබා දිය යුතුය. එසේම ජාත්‍යන්තර ස්වාධීන උපදේශකයන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමේ නිත්‍යානුකූලභාවයට අභියෝග කරමින් එහි කාර්ය සීමා කිරීමට තැත් දරනු වෙනුවට එහි සම්පත්වලින් පූර්ණ ප්‍රයෝජන ලබා ගැනීම ද කළ යුතු ය.

මෑතදි එක්සත් ජනපද කොංග්‍රස් සභාවේ සභිකයන් වෙත ඇමරිකාවේ සිටින ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් යැවුණු ලිපියකින් මෙහි මානව අයිතීන් පිළිබඳ තත්වය නිරීක්ෂණය කිරීමට එක්සත් ජාතීන්ගේ සංගමය කළ ඉදිරිපත්වීම ප්‍රතික්ෂේප කොට තිබුණි. ඒ වෙනුවට රජයේ පොලීසියේ හා අධිකරණයේ හැකියා ශක්තිමත් කර ගැනීම සඳහා අවශ්‍ය ශිල්පීය සහාය ඉල්ලා තිබුණේ ය. කෙසේ වෙතත් මේවා මනාපයන් නොවිය යුතුය. මෑතකාලීන නේපාලයේ අත්දැකීම් පෙන්නුම් කරන ආකාරයට සිය පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදී රජයේ හාකියාව වර්ධනය කිරීමට සහ එයට අවශ්‍ය සහාය දීමේලා එක්සත් ජතීන්ගේ මානව හිමිකම් නිරීක්ෂනයන්ට වැදගත් කාර්‍ය භාරයක් ඉටු කළ හැකිය. ශ්‍රී ලංකා රජය එක්සත් ජතීන්ගේ මානව හිමිකම් නිරීක්ෂනයන් යන්න දඬුවමක් හෝ ආක්‍රමණයක් ලෙස දැකිය යුතු නැත. එය රජයේ ආයතනවලට සිය කාර්ය වඩා හොඳින් ඉටු කිරීම සඳහා උපකාර කිරීමට නිර්මාණය කරණ ලද්දකි. මෙය කෙරෙන්නේ එක් අතකට සාක්ෂි කරුවන්ගේ ආත්ම විශ්වාසය වැඩි කරවමිනි.

දෙවනුව ආණ්ඩුවක පරම වගකීම සිය වැසියන් අනවශ්‍ය අවදානමක නොහෙළීමය. මෙම හේතුව නිසා තම යුදමය මෙහෙයුම එල්ටීටීඊය යටතේ පවතින උතුරු පළාතේ ප්‍රදේශ වෙත විහිදුවීමේ පෙළඹවීම පාලනය කර ගත යුතු ය. මෙහිදීද ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මිතුරන් විසින් ඉටු කළ යුතු කාර්යක් තිබෙයි. ශ්‍රී ලංකාවේ තුළ සාමය පිහිටුවාලීමට වෑයම් දරන්නන්ට විශේෂයෙන් දුෂ්කර ප්‍රශ්නයක් වී ඇත්තේ එක් පැත්තකින් එල්ටීටීඊය හසුරුවා ලීමේ හා හීලෑ කරලීමේ සැබෑ දුෂ්කරතාව හේතුවෙනි. 2005 අවසානයේ සහ 2006 ආරම්භයේ කොටි සංවිධානය විසින් හිතාමතාම කුපිත කරවන ආකාරයෙන් රජයේ හමුදා වෙත එල්ල කළ

ප්‍රහාරයන් සහ සිවිල් වැසියන් ඉලක්ක කිරීමේ ඔවුන්ගේ අතීත පුරුද්ද සහ උතුරේ ඔවුන්ගේ පාලනයේ පැවති කෲර ස්වභාවය යන තත්ත්වයන්හිදී පැහැදිළිවම රජයට නීත්‍යානුකූල ආරක්‍ෂක අවශ්‍යතාවන් පවතින අතර රජය ඒවාට ප්‍රතිචාර දැක්විය යුතුය. ශ්‍රී ලංකා රජයට ස්වකීය ආරක්ෂාව සඳහාත් තම රටවැසියන් ආරක්ෂා කරගැනීම සඳහාත් දරන නීත්‍යනුකූල ප්‍රයත්නයන්ට ජාත්‍යන්තර ආධාරක රටවලට සහයෝගය දැක්විය හැක්කේ කොටි සංවිධානය ලොව පුරා කරන අරමුදල් එකතු කිරීම්, යුද අවි මිලට ගැනීම් සහ ශ්‍රී ලංකාවෙන් පිටත විසිරී සිටින දෙමළ ජනතාව කෙරේ විහිදුවන බලහත්කාරී පාලනය ආදිය මර්දනය කිරීමෙනි.

කොටි සංවිධානයට පසුගිය යුගයේ දී තම ශක්තිය තහවුරු කරගැනීමට ඉඩදීම ගැන ඇතැම් විදේශීය රාජ්‍ය වගකිව යුතු වේ. එය සිදු වුණේ එක් අතකින් ඔවුන් නිත්‍යානුකූල ජාතික විමුක්ති සංවිධානයක් ය යන නොමඟ ගිය කල්පනාව නිසා ය. දැන් එම වරදට පිළියම් යෙදීමට කාලය එළඹ තිබේ. ඒ සඳහා ඔවුන්ට යුද්ධ කිරීමත් ත්‍රස්තවාදී ප්‍රහාර එල්ල කිරීමත් අපහසු කරවිය යුතු ය. ඒ සඳහා එල්ටීටීඊයට අරමුදල් රැස් කිරීමටත් අවි ආයුධ මිලට ගැනීමටත් ප්‍රචණ්ඩත්ව ප්‍රචාර විසුරුවා හැරීමටත් එරෙහිව දැනටමත් පනවා ඇති සම්බාධක වඩා මැනවින් ක්‍රියාත්මක කළ යුතු ය.

මේ සියලු දෑ කියා සහ කරවා අවසන් වූ පසු එක් අවිනිශ්චිත කරුණක් ඉතිරිව තිබේ. එනම්, දැනට ඇති ඓතිහාසික හා විග්‍රහාත්මක සාධක අනුව බලන කල කොටි සංවිධානය යුදමය වශයෙන් පරාජය කිරීමේ හැකියාව තිබේ දැයි සැක සහිතය යන්න යි. කෙසේ වෙතත් කොටි සංවිධානය සම්පූර්ණයෙන් පරාජ කල නොහැකි නමුත් හමුදාමය වශයෙන් එය දුර්වල කිරීමෙන් සාකච්ඡා සඳහා සැබවින්ම ඔවුන් නමම්වා ගත හැකියි ඇතැම්මු තර්ක කරතs'. වසර ගණනාවක් පුරා එසේ කිරීම නැවත නැවතත් ප්‍රතික්ෂේප කළ පසු සත්‍ය ලෙසම සාකච්ඡා ආරම්භ කිරීමට කොටි සංවිධානයට බලකිරීම සඳහා ඇතැම් ක්‍රියා මාර්ග සොයාගත යුතුය යන්න සත්‍යයකි. එහෙත් එය කළ යුතු ආකාරය වන්නේ වන්නියේ ඔවුන් පාලනය කරන ප්‍රදේශවල පාලනය නැවත ලබා ගැනිමට උත්සාය කිරීම යැයි සිතාගත නොහැකිය. කොටි සංවිධානය සැලකිය යුතු ලෙස දුර්වල කළ හැකියි සිතුවත් ඔවුන් සාකච්ඡා සඳහා උනන්දු කිරීමේලා එය සුදුසු නැතැයි පසුගිය වසර තිහ අපට කියා දෙයි. මෙවැනි තත්ත්වයක් තුළ අසම්මත යුධ ක්‍රියාමාර්ග සඳහා පසු බැසීම සහ දෙමළ ජනතාව වෙත ප්‍රහාර එල්ල කිරීම සඳහා ආණඩුව සහ සිංහලයින් උසි ගැන්වීම සඳහා බොහෝ විට සැලසුම් කළ ප්‍රහාරයන් දියත් කිරීම ආදිය LTTE යේ වඩා විය හැකි ප්‍රතිචාරයන්ය.

තෙවනුව දෙමළ ජනතාවගේ ඉල්ලීම තුළ පවතිය හැකි යුක්තියක් වෙත අනුකූලතාවක් දක්වන දේශපාලන විසඳුමක් පිළිබඳව අවංකවම සොයා බැලීම රජයේ වගකීමකි. "පසුව සාකච්ඡා කිරීම සඳහා දැන් සටන් කරමු" යන උපාය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළ හැකි නම් එය සාර්ථක වන්නේ බෙදුම්වාදී නොවන සහ LTTE නොවන ද්‍රවිඩ කොටස් ඉල්ලා සිටින සහ අඩුම තරමින්

LTTE තුළම සාකච්ඡාවිය හැකි දේශපාලන සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනා මාලාවක් සඳහා රජය සූදානම් නම් පමණි.

අවසානයේදී කොටි සංවිධානය ප්‍රතිචාර දැක්විය හැකියි සිතිය හැකි එකම පීඩනය දේශපාලන පීඩනයයි. ද්‍රවිඩ ජනතාවගේ දුක් ගැනවිළි වලට විසඳුම් දෙන ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා අවසානයේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක පාම්ණෙන එකඟතාව මත ඇතිවන දේශීය පීඩනය සහ යුද්ධය පවත්වා ගෙන යාම සඳහා අරමුදල් රැස් කිරීමේ සහ උතුර ඔවුන්ගේ ග්‍රහණය මත පවත්වාගෙන යාමේ කොටි සංවිධානයේ හැකියාව සීමා කරන ආකාරයේ ජාත්‍යන්තර පීඩනයේ සංයෝජනයක් මේ සඳහා තිබිය හැකිය. රජයේ අනුරූප දේශපාලන ක්‍රියාවලියකින් තොරව කොටි සංවිධානය මත ඇතිවන ජාත්‍යන්තර පීඩනය ඵලදායී නොවිය හැකිවා පමණක් නොව එය තව දුරටත් කොටි සංවිධානය හුදකලා කිරීමට සහ අන්තවාදය දෙසට තල්ලු විමට මෙන්ම මධ්‍යස්ථ ද්‍රවිඩ ප්‍රජාව ඔවුන් දෙසට තල්ලු විමට හේතු වන ප්‍රමාණයට බොහෝ විට එය දුස් ඵලදායී විමට පවා හැකිය. මෙහිදී ඉතාමත්ම කෙටියෙන් කිව යුත්තේ රජය අඩුම තරමින් බෙදුම්වාදී නොවන දෙමළ නායකයන් සැබෑ ලෙස පිළිගන්නා ව්‍යවස්ථාමය විසඳුමක් ඉදිරිපත් කරන තෙක් උතුරේ පහරදීමේ ක්‍රියාන්විතයන් සඳහා ජාත්‍යන්තර සහායක් නොතිබිය යුතුය යන්නයි.

නිම් ක්‍රියාවලියක් සපයk තිස්ස විතාරණ අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් රැස්වන සර්ව පාක්ෂික සමුළුව හරහා ශ්‍රීලනිපය හා රජය තුළ මෙන් ඉන් පිටත සිටින පක්ෂවලට එබඳු යෝජනාවක් ගැන සම්මුතියකට එළඹිය හැකිය. මෙහිදී විද්වත් කමිටුව නිකුත් කළ බහුතර වාර්තාව හා සුළුතර වාර්තාව යන දෙක අවසාන එකඟතාවක් ගොඩ නඟා ගැනීමට මනා ආරම්භයක් සපයා දේ. රජය විසින් සර්ව පාක්ෂික සමුළු ක්‍රියාදාමය දිරි ගැන්වීම පිණිස කළ හැකි සියලු දේ ඉටු කළ යුතු ය. ආරම්භයක් ලෙස කළ හැක්කේ ශ්‍රිලනිපය තමන්ගේ යෝජනාවේ ම එල්බ නොසිටින බවට හා පළාත් මට්ටමේ වඩා පුළුල් බලය බෙදා හැරීමකට පොදු එකඟතාවක් ඇති වුවහොත් එයට එරෙහිව නොයන බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කිරීම ය. ඒ අතර විපක්ෂයේ දේශපාලන පක්ෂ - විශේෂයෙන් එක්සත් ජාතික පක්ෂය - මූලික සහ කල්පවතින විසඳුමක් සකස් කිරීම සඳහා වන අර්ථවත් යෝජනා දියුණු කිරීමේදී එයට සහාය දීමට සිය කැමත්තෙන්ම ක්‍රියාකාරීව සහ උද්යෝගිමත්ව මේ ක්‍රියාවලියේ සාමාජිකයින් වීම අවශ්‍යය ය.

www.padippakam.com

## IV

'R2P' මූලධර්මය පිළිබඳ මා මෙතෙක් සඳහන් කළ කරුණු වර්ථමාන ශ්‍රී ලංකාව තුළ සිත් කම්පාකරවන තත්ත්වයට භාවිතා කරනු ඇත්තේ කෙසේදැයි යන්න ඇතුළුව, එය සංකීර්ණ සහ බහු මිනුම් සංකල්පයක්ය බව පැහැදිලි වන්නට ඇතයි මා බලාපොරොත්තු වෙමි. එසේම 'R2P' මූලධර්මය සැලසුම් වූයේ පැහැදිළිවම හික්මවිය නොහැකි අභ්‍යන්තර තත්ත්වයන් සඳහා ජාත්‍යන්තර සහාය ද ඇතිව මග සොයා ගැනීමට රටවලට නියම ආකාරයෙන් උපකාර කිරීම ඉලක්ක කර ගෙනය. එසේම මෙම සංකල්පය බටහිර අධිරාජ්‍යවාදීන්ගේ ආයුධයක් ලෙස විස්තර කිරීම සරලව හාස්‍ය ජනකය.

අද නීලන් තිරුචෙල්වම් ජීවත් ව සිටියා නම් මෙය අවබෝධ කර ගැනීමේ කිසිදු අපහසුවක් ඔහුට තිබෙනු ඇතැයි නොසිතමි. රාජ්‍යය හෝ ජාතිය හෝ ජනතාව පිළිබඳ කිසිම වැසුණු ස්ථිතික ස්ථාවරයකට ඔහුගේ පාක්ෂපාතීත්වයන් නොවීය. රජ්‍ය ස්වාධිපත්‍යයේ සීමාවන් සහ ස්වාධිපති රාජ්‍යයක වගකීම්වල ස්වභාවය කුමක්ද යන්න පිළිබඳ හොඳ අවබෝධයක් තිබුණි. ඔහුගේ ප්‍රධාන බුද්ධිමය හා දේශපාලන අරගලය වූයේ සිංහල හෝ දෙමළ හෝ වේවා එකිනෙක පරයා යන සහ ආරක්ෂාකාරී ජාතිවාදයන්ගෙන් ඔබ්බට ගිය ශ්‍රී ලාංකීය දේශපාලනය ප්‍රතිනිර්මාණය කිරීමට සහායවීමය. නියම සර්වදේශවාදියකු ලෙස මේ තුළ ඔහුගේ ඉදිරි දර්ශනය වූයේ එවැනි රාජ්‍ය සංස්ථාවක හැකියාවන් පිළිබඳ දැනුවත්ව සිටීමෙන් පුළුල් ලෝකයකට දායක වීය හැකිව තිබුණු බවයි. ප්‍රතිපත්තිමය සහ සංගත ආකාරයක් තුළ ක්‍රියාකාරි වූ පුළුල් ජාත්‍යන්තර ප්‍රජාවට එය සැපයුවේ කුමක්ද? මේ රට තුළ සාමයි, ස්ථායීතාව සහ සංවර්ධනයෙහිලා එයට දායක වීය හැකිව තිබුණු බවයි

වදන්වල හා අදහස්වල බලය, බහුවිධතාව සහ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඔයුගේ ඇදහීම, මානව අයිතීන් හා නීතියේ ආධිපත්‍යය සුරැකීම සඳහා ඔහු දැක්වූ ක්‍රියාශීලිත්වයත් තම දේශය විසින් තමන් වෙතම පමුණුවා ගත් වේදනාකාරී තුවාල සුව කිරීමේලා සාකච්ඡාමය ක්‍රියාදාමයක් පිණිස වෙහෙස නොබලා ගත් ප්‍රයත්නයත් නිසා ඔහු ශ්‍රේෂ්ඨ ශ්‍රී ලාංකිකයෙකු වූවා පමණක් නොව ශ්‍රේෂ්ඨ ජාත්‍යන්තර පුරවැසියෙකු ද බවට පත් විය. අද අප මේ සමරන්නේ එවැන්නෙකුගේ මතකයයි. ඔහුගේ විශ්වාසය හා ප්‍රතිපත්ති මෙන්ම ඒවා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට ඔහු තුළ වූ හැකියාව ශ්‍රී ලංකාවට මෙන්ම පුළුල් ගෝලීය ප්‍රජාවට අන් කවදාටත් වඩා තදබල ලෙස අවශ්‍ය වී ඇත.



படிப்பகம்